*සටහන*.-මෙම විෂයය සඳහා අපේක්ෂකයෙකු අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

12.3.2 පරිපාලනය (විෂයය අංකය 02-III-ලකුණු 100යි)

පහත සඳහන් කරුණු පදනම් වන එක් ප්‍රශ්න පත්‍රයකි.

(i) ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද I, II, III, V, VI, VII, IX, XI, XXIII, XXV, XXVI, XXVII, XXVIII, XXIX, XXX, XXXI, XXXII, XXXIII, XLVII හා XLVIII

(ii) අංක 1589/30 දරන 2009.02.20 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති.

*සටහන*.-මෙම විෂයය සඳහා අපේක්ෂකයෙකු අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතු ය.

12.4 ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ III ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය : (අංක 1670/33 හා 2010.09.10 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 03 වැනි පරිශිෂ්ටය)

පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා වන විෂයයන් පහත දැක්වේ. :

| *අනු අංකය* | *විෂයය* | *කාලය* | *විෂය අංකය* |
|---|---|---|---|
| 01 | රජයේ මූල්‍ය පරිපාටි | පැය 03 | 06 |
| 02 | නීතිය හා කළමනාකරණය | පැය 03 | 07 |
| 03 | පරිපාලනය | පැය 03 | 02 - IV |
| 04 | වාර්තා ලිවීම හා කළමනාකරණය වෙත තොරතුරු ඉදිරිපත් කිරීම | පැය 03 | 08 |

12.4.1 රජයේ මූල්‍ය ක්‍රියා පරිපාටි (විෂය අංක 06) (ලකුණු 100)

රජයේ ගනුදෙනුවලට මුදල් රෙගුලාසි හා භාණ්ඩාගාරයේ චක්‍රලේඛ යොදු ගැනීම, රාජ්‍ය ආදායමට ඇති සම්බන්ධතාව අනුව මුදල් රෙගුලාසි/ක්‍රියා පිළිවෙත්, වියදම්, විදේශ ආධාර, වාර්ෂික හා අතිරේක ඇස්තමේන්තු, රජයේ ණය, සැපයුම් ටෙන්ඩරය, අග්‍රිම හා අත්තිකාරම් මුදල් අනුඥත, රාජ්‍ය ගිණුම්, කාර්යබද්ධ හා ආර්ථික වර්ගීකරණයන්, වැඩසටහන් හා කාර්ය සාධන අයවැය, මුදල් අමාත්‍යවරයාගේ කාර්යයන්, මහා භාණ්ඩාගාරය, මුදල් අමාත්‍යාංශය, ලේකම්වරු, විගණකාධිපති හා රජයේ ගිණුම් කමිටුව සම්බන්ධයෙන් රජයේ මුදල් රෙගුලාසි හා භාණ්ඩාගාර චක්‍රලේඛ යොදගනු ලබන ආකාරය පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනීම පරීක්ෂා කෙරේ.

12.4.2 නීතිය හා කළමනාකරණය (විෂය අංක - 07) (ලකුණු 100)
නීතිය : නීතිය පිළිබඳ නිර්වචනය
ශ්‍රී ලංකාවේ නීති පද්ධති
ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධති
ගිවිසුම් නීතිය
නියෝජිතායතන නීතිය
භාණ්ඩ විකිණීම
වාරික මුදල් ගෙවීමේ ක්‍රමයට මිලදී ගැනීම
ගනුදෙනු කළ හැකි පිළිනයන්
ඇප සහතික කිරීම
රක්ෂණය

කළමනාකරණය ඃ

කළමනාකරණය පිළිබඳ හැඳින්වීම
කළමනාකරුවන්ගේ කාර්යයන් හා දක්ෂතා
සැලසුම් ක්‍රියාවලිය හා සංවිධාන මට්ටම් ඇති කිරීම
සංවිධාන ව්‍යුහය
මානව සම්පත් කළමනාකරණය
කාර්ය සාධන ඇගයීම
ප්‍රවර්ධනය
අභිප්‍රේරණය
නායකත්වය
සන්නිවේදනය
තීරණ ගැනීම
ගැටලු නිරාකරණය
වෙනස්වීම් කළමනාකරණය
කළමනාකරණ ගැටුම්
කළමනාකරණ කාලය
තත්ත්ව  චක්‍ර හා නිෂ්පාදන හා ඵලය
කළමනාකරණය ආචාරධර්ම හා වගකීම්

12.4.3 පරිපාලනය (විෂය අංක - 02 - IV) (ලකුණු 100)
ආයතන සංග්‍රහයේ පරිච්ඡේද VII, IX, XI, XII, XV, XXIII, XXV, XXVI, XXVII, XXVIII, XXIX, XXX, XXXI, XXXII, XXXIII, XLVII, XLVIII

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති පළමුවන කාණ්ඩයේ i සිට vi දක්වා පරිච්ඡේද

12.4.4. වාර්තා ලිවීම හා කළමනාකරණය වෙත තොරතුරු ඉදිරිපත් කිරීම (විෂය අංක - 08) (ලකුණු 100)

කළමනාකරණ තොරතුරු සම්බන්ධයෙන් කාලානුරූප වීමේ නිරවද්‍යතාව සහ පරිපූර්ණබවෙහි වැදගත්කම.

ආශ්‍රය තොරතුරු පරිහරණය
කාලානුරූප හා තදුචිත වාර්තා
රැස්වීම් වාර්තා හා සටහන් ලිවීම
කළමනාකරණ වාර්තා ව්‍යුහය
විශේෂයක් දැක්විය යුතු වැදගත් ප්‍රතිඵල
ප්‍රතිඵල අර්ථකථනය
විචල්‍යයන් යෝජනා කිරීම
දත්ත විශ්ලේෂණයේ දී සංඛ්‍යානාම ක්‍රම භාවිතය
කාර්ය සාධනය සැසඳීම
කළමනාකරණ වාර්තාවල අනුපාත හා ප්‍රතිශත භාවිතය
රේඛා චිත්‍ර මගින් නිරූපණය
වෘත්තීයමය කථා හා දේශනවලට සවන්දීම
කථනයෙන් දේශන වාර්තා කිරීම
විෂය මඩුලු සාකච්ඡා
සම්මන්ත්‍රණ දක්ෂතා
කථා පැවැත්වීම

*සටහන* ඃ- සමාර්ථය සඳහා අයදුම්කරුවන් සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහාම 40%ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

12.5 ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා පැවැත්වෙන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය (අංක 1670/32 හා 2010.09.10 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ ඇ පරිශිෂ්ටය)

පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා වන විෂයයන් පහත දැක්වේ ඃ

| විෂය අංකය | විෂයය | කාලය (පැය) | විෂය අංකය |
|---|---|---|---|
| 01 | ක්‍රමසම්පාදන සංකල්පයන් සහ විධි ශාස්ත්‍රය, ක්‍රමසම්පාදන ආයතන | 03 | 09 |
| 02 | ආර්ථික විශ්ලේෂණය හා සංඛ්‍යානය | 03 | 10 |
| 03 | ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම | 03 | 11 |
| 04 | ආයතන රෙගුලාසි සහ රාජ්‍ය අංශයේ මූල්‍ය ක්‍රම | 03 | 12 |
| 05 | ඉංග්‍රීසි භාෂාව | 03 | 13 |

12.5.1 සේවා ව්‍යවස්ථාවේ හා පත්වීම් ලිපියේ විධිවිධාන පරිදි නියමිත කාල සීමාව තුළ හෝ ඊට පෙර විභාගය සමත් විය යුතු අතර, සියලුම විෂයයන් සඳහා එකම වාරයක දී හෝ වෙන් වෙන් වශයෙන් වාර කීපයක දී හෝ පෙනී සිටීමට නිලධාරියෙකුට අවසර ඇත.

විභාග පටිපාටිය :

**12.5.2 ක්‍රමසම්පාදන සංකල්පයන් සහ විධි ශාස්ත්‍රය, ක්‍රමසම්පාදන ආයතන (විෂයය අංකය - 09)**

(i) ජාතික පරමාර්ථ හා ප්‍රමුඛතාවයන් සහ ඒවා සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රමසම්පාදන ප්‍රතිපත්ති රාමුව සහ වැඩසටහන්.
(ii) ජාතික ක්‍රමසම්පාදනය සඳහා විධි ශාස්ත්‍රය ක්‍රමසම්පාදනයෙහිලා ප්‍රධාන ගැටලු තැන්, පොදු ජන සහභාගිත්වය, සම්පත් යෙදවීම ආදිය.
(iii) ජාතික ක්‍රමසම්පාදනය සඳහා දත්ත ස්වභාවය සහ මූලාශ්‍ර, දත්ත රැස්කිරීම, අර්ථ නිරූපණය ඉදිරිපත් කිරීම සහ විශ්ලේෂණය, ක්ෂේත්‍ර අධීක්ෂණ හා විමර්ශන ජන විකාශනය සංකල්ප, ආර්ථික විද්‍යා ප්‍රක්ෂේපණ හා ප්‍රතිපත්ති විශ්ලේෂණ.

**12.5.3 ආර්ථික විශ්ලේෂණය හා සංඛ්‍යානය (විෂයය අංකය - 10)**

(i) නිපැයුම් හා බෙද හැරීම පිළිබඳ න්‍යායයන් කෙරෙහි විශේෂ සැලකිල්ලකින් යුතුව ආර්ථික විද්‍යා මූලධර්ම.
(ii) මුදල්, බැංකු ක්‍රම, ජාත්‍යන්තර මූල්‍ය ක්‍රම හා වෙළෙඳාම.
(iii) මූල්‍ය, මුදල්, වෙළෙඳ හා තීරුබදු ප්‍රතිපත්ති විශ්ලේෂණය.
(iv) ශ්‍රී ලංකාවේ ආර්ථික ව්‍යුහය.
(v) ආර්ථිකය සමාලෝචනය කිරීම.
(vi) ශිල්පීය පුහුණු සහ නුපුහුණු මිනිස් බලය හා විදේශාධාර ඇතුළු වෙනත් සම්පත් තක්සේරු කිරීම සහ ඒවා උපයෝගීකරණය.
(vii) ආර්ථික විද්‍යාත්මක සහ සමාජයීය සිද්ධි.
(viii) ආර්ථික විශ්ලේෂණය සහ ක්‍රමසම්පාදනයෙහිලා උපයෝගී කරගන්නා මූලික සංඛ්‍යානය සංකල්ප හා ක්‍රම.
(ix) ප්‍රතිලාභ/පිරිවැය විශ්ලේෂණ මූලධර්ම.

**12.5.4 ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණ සහ පසු විපරම් කිරීම හා ඇගයීම (විෂයය අංකය - 11)**

(i) ව්‍යාපෘති සැලසුම් කිරීම, හඳුනා ගැනීම සහ නිර්වචනය කිරීම හා ව්‍යාපෘති සම්පාදනය, ප්‍රතිපත්ති, සිද්ධාන්ත, ස්ථානය තෝරා ගැනීම, තාක්ෂණය සහ පිරිවැය සහ ප්‍රතිලාභ ඇස්තමේන්තු කිරීම, තාක්ෂණික මූල්‍ය හා ආර්ථික විශ්ලේෂණය.
(ii) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ මෙහෙයවීම/අධීක්ෂණය, ව්‍යාපෘති සහ වැඩසටහන් නිසියාකාරව සහ කාලීනව ක්‍රියාත්මක කිරීම, සවිස්තරාත්මක ක්‍රියාකාරී සැලසුම් හා ක්‍රියාත්මක කිරීමේ උපලේඛන සැකසීම, පසුවිපරම් සහ ප්‍රගති පාලනය සම්බන්ධීකරණය සහ ඉදිරි කටයුතු.
(iii) ව්‍යාපෘති ඇගයීම, ව්‍යාපෘතිවල සහ වැඩසටහන්වල සාකල්‍යය තක්සේරු කිරීම, පිරිවැයට සාපේක්ෂව ප්‍රතිලාභ විශ්ලේෂණය.

**12.5.5 ආයතන රෙගුලාසි සහ රාජ්‍ය අංශයේ මූල්‍ය ක්‍රම (විෂයය අංකය - 12)**

(i) ආණ්ඩුවේ මුදල් රෙගුලාසි 1 වැනි කාණ්ඩය ( X වන පරිච්ඡේදය හැර)
(ii) ආයතන සංග්‍රහයේ පරිච්ඡේද VII, IX, XI, XII, XV, XXIII, XXV, XXVI, XXVII, XXVIII, XXIX, XXX, XXXI, XXXII, XXXIII, XLVII, XLVIII
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති පළමුවන කාණ්ඩයේ I සිට VI දක්වා පරිච්ඡේද
(iii) ශ්‍රී ලංකාවේ මූල්‍ය පාලනය.-රාජ්‍ය මූල්‍ය කළමනාකරණයට අදාළ ව්‍යවස්ථාමය විධිවිධාන, රාජ්‍ය මූල්‍ය සම්බන්ධ පාර්ලිමේන්තුවේ පාලනය, ඒකාබද්ධ අරමුදල සහ එහි ක්‍රියාකාරිත්වය, විසර්ජනයේ අරමුණ හා විසර්ජන ක්‍රම, රාජ්‍ය

ආදයම, මුදල් ඇමතිවරයාගේ බලතල හා කාර්යභාරය, භාණ්ඩාගාරයේ බලතල හා කාර්ය භාරය, වොරන්ට් සහ අග්‍රිම අධිකාරිය, විගණකාධිපති, ඔහුගේ බලතල හා කාර්යභාරය, රාජ්‍ය වියදම් කමිටුව, රාජ්‍ය ව්‍යාපාර කමිටුව.

(iv) ගිණුම් නිලධාරීන්, ප්‍රධාන ගිණුම් නිලධාරීන් හා රාජ්‍ය ආදයම පිළිබඳ ගිණුම් නිලධාරීන් පත් කිරීම, ඔවුන්ගේ බලතල හා කාර්යභාරය.

(v) රාජ්‍ය වියදම් සැලසුම් කිරීම හා කළමනාකරණය, සංවිධානවල අරමුණු හා කාර්යභාරයන් හඳුනාගැනීම, වාර්ෂික ආදයම් හා ඇස්තමේන්තු සැකසීම හා අවසන් තීරණ ගැනීම, අනුමත වියදම් ඇස්තමේන්තුවල වෙනස්කම් කිරීම, වීරමොං පරිපාටිය ක්‍රියාත්මක කිරීම, රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා කළමනාකරණය, පරිපූරක ඇස්තමේන්තු.

(vi) *රජයේ ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය.*-භාණ්ඩ සේවා හා වැඩ ලබා ගැනීම, ටෙන්ඩර් මණ්ඩල හා තාක්ෂණ ඇගයුම් කමිටුවල සංයුතිය, පත්කිරීම්, බලතල හා කාර්යභාරය, ටෙන්ඩර් ඇගයීමේ ක්‍රියාපටිපාටිය, විදේශ ආධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවල කළමනාකරණය.

12.5.6 **ඉංග්‍රීසි භාෂාව (විෂයය අංකය - 13)**

ක්‍රමසම්පාදනය, සංවර්ධනය, සැලසුම්කරණය හා කළමනාකරණය යන විෂයයන්ට අදළව අපේක්ෂකයින්ගේ අධ්‍යාපනික හා වෘත්තීය ඉංග්‍රීසි භාෂා කුසලතාවය මැනීම සඳහා ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ලිඛිත පරීක්ෂණයක් පවත්වනු ලැබේ.

***සටහන.***-සාමාර්ථය සඳහා අයදුම්කරුවන් සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහාම 40% ක ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතු ය.

13. මෙම විභාගය සඳහා වන කාල සටහන පහත පරිදි වේ. :

| *අනු. අංකය* | *විභාගයේ නම* | *විෂයය* | *විෂය අංකය* | *දිනය* | *වේලාව* |
|---|---|---|---|---|---|
| 01 | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය හා පරිපාලන නීතිය | 01-I | 2016.10.22 | පෙ. ව. 09.00- මධ්‍යාහ්න 12.00 |
| | | ශ්‍රී ලංකාවේ නීති ක්‍රම අපරාධ නීතිය හා | 01-II | 2016.10.22 | ප. ව. 12.30 ප. ව. 3.30 |
| | | සාක්ෂ්‍ය නීතිය | 01-III | 2016.10.23 | පෙ. ව. 9.00- මධ්‍යාහ්න 12.00 |
| | | පරිපාලනය | 02-I | 2016.11.05 | පෙ. ව. 9.00 මධ්‍යාහ්න 12.00 |
| | | ආර්ථික විද්‍යාව සමාජ විද්‍යාව | 03 | 2016.10.23 | ප. ව. 12.30 - ප. ව. 3.30 |
| | | රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය | 04 | 2016.11.19 | පෙ. ව. 9.00- මධ්‍යාහ්න 12.00 |
| 02 | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | මූල්‍ය ක්‍රම | 05-I | 2016.11.20 | පෙ. ව. 9.00 මධ්‍යාහ්න 12.00 |
| | | පරිපාලනය | 02-II | 2016.11.06 | පෙ. ව. 9.00 මධ්‍යාහ්න 12.00 |
| 03 | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | මූල්‍ය ක්‍රම | 05 - II | 2016.11.20 | ප. ව. 12.30 - ප. ව.3.30 |
| | | පරිපාලනය | 02 - III | 2016.11.06 | ප. ව. 12.30 - ප. ව. 3.30 |
| 04 | ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | මූල්‍ය ක්‍රම | 05-II | 2016.11.20 | ප. ව. 12.30 - ප. ව. 3.30 |
| | | පරිපාලනය | 02-III | 2016.11.06 | ප. ව. 12.30- ප. ව. 3.30 |
| 05 | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | රජයේ මූල්‍ය පරිපාටි | 06 | 2016.11.19 | ප. ව. 12.30- ප. ව. 3.30 |
| | | නීතිය හා කළමනාකරණය | 07 | 2016.11.26 | පෙ. ව.9.00 මධ්‍යාහ්න 12.00 |

| අනු. අංකය | විභාගයේ නම | විෂයය | විෂයය අංකය | දිනය | වේලාව |
|---|---|---|---|---|---|
| | | පරිපාලනය | 02-IV | 2016.11.05 | ප. ව. 12.30- ප. ව. 3.30 |
| | | වාර්තා ලිවීම හා කළමනාකරණය වෙත තොරතුරු ඉදිරිපත් කිරීම | 08 | 2016.11.26 | ප. ව. 12.30 ප. ව. 3.30 |
| 06 | ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා පැවැත්වෙන පළමුවන වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | ක්‍රම සම්පාදන සංකල්පයන් සහ විධි ශාස්ත්‍රය, ක්‍රමසම්පාදන ආයතන | 09 | 2016.12.03 | පෙ. ව. 9.00- මධ්‍යාහ්න 12.00 |
| | | ආර්ථික විශ්ලේෂණය හා සංඛ්‍යානය | 10 | 2016.12.03 | ප. ව. 12.30- ප. ව. 3.30 |
| | | ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම | 11 | 2016.12.10 | පෙ. ව. 9.00- මධ්‍යාහ්න 12.00 |
| | | ආයතන රෙගුලාසි සහ රාජ්‍ය අංශයේ මූල්‍ය ක්‍රම | 12 | 2016.12.10 | ප. ව. 12.30 - ප. ව. 3.30 |
| | | ඉංග්‍රීසි භාෂාව | 13 | 2016.12.11 | පෙ. ව. 9.00 - මධ්‍යාහ්න 12.00 |

14. 14.1 කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට අදාළ විෂයයන්ගේ සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීම පහත පරිදි වේ :—

| විභාගය | විෂයය | නිදහස් කරනු ලැබීමට අවශ්‍ය සුදුසුකම් |
|---|---|---|
| ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | නීතිය | බැරිස්ටර්වරයෙකු, ශ්‍රේෂ්ඨාධිකරණයේ අධි නීතිඥවරයකු, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන, කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක නීතිය පිළිබඳ උපාධිධාරියකු වීම. |

**සටහන 1 .**—අංක 1419/3 හා 2005.11.14 දිනැති ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථාව යටතේ 2012.07.01 දින සිට 2013.12.23 දින දක්වා බඳවා ගන්නා ලද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා ද, එම සේවා ව්‍යවස්ථාවේ පරිදි පළමුවන කාර්යක්ෂමතා කඩඉමෙහි සමාජ විද්‍යාව හෝ ආර්ථික විද්‍යාව සඳහා ලබාදුන් නිදහස් කිරීම අදල වේ.

14.2 ශ්‍රී ලංකා පරිපලන සේවා ව්‍යවස්ථාවේ අන්තර්කාලීන විධිවිධාන 1.5 (ආ) පරිදි එම ව්‍යවස්ථාව බලාත්මක වන දිනට (2012.07.01) පෙර පැවැති ව්‍යවස්ථා විධිවිධාන යටතේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත්විය යුතුව තිබූ නමුත්, 2014.12.31 දිනට එසේ සමත් වීමට අපොහොසත් වන නිලධාරීන්, පැවැති ව්‍යවස්ථාවට අනුව එක් එක් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ විෂයයන්ට අනුරූපී වන දනට ක්‍රියාත්මක ව්‍යවස්ථාව යටතේ පැවැත්වෙන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණවල විෂයයන් සමත්වීමෙන් කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කළ යුතු ය. අනුරූපී විෂයයන් පහත සඳහන් වගුවෙහි දක්වේ. ා

| අංක 1419/93 හා 2005 නොවැම්බර් මස 14 දිනැති ව්‍යවස්ථාව | අංක 1842/2 හා 2013.12.23 දිනැති නව සේවා ව්‍යවස්ථාව |
|---|---|
| පරිපාලනය<br>පළමුවන (I) කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | පරිපාලනය<br>පළමුවන (I) කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය |
| රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය<br>දෙවන (II) කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය හා ප්‍රසම්පාදනය ක්‍රියාවලිය<br>පළමුවන (I) කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය |
| (*අ*) ආර්ථික විද්‍යාව හෝ<br>(*ආ*) සමාජ විද්‍යාව<br>පළමුවන (I) කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | ආර්ථික විද්‍යාව හා සමාජ විද්‍යාව<br>පළමුවන (I) කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය |
| නීතිය<br>පළමුවන (I) කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | නීතිය<br>පළමුවන (I) කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය |

15. *ප්‍රතිඵල නිකුත් කිරීම*.-මෙම විභාගයට අයදුම් කළ/පෙනී සිටි සියලු අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි පළ කරනු ලැබේ. ඉලෙක්ට්‍රොනික ලේඛන හා ඉලෙක්ට්‍රොනික සන්නිවේදනය පිළිබඳව වූ ජනාධිපති ලේකම්ගේ අංක SP/SB/1/13 හා 2009.10.13 දිනැති චක්‍රලේඛය අනුව අමාත්‍යාංශ වෙබ් අඩවියේ සඳහන් ප්‍රතිඵල පළ කිරීම නිලධාරීන්ට ප්‍රතිඵල නිකුත් කිරීමක් ලෙස සැලකිය යුතු ය. මේ අනුව දෙපාර්තමේන්තු ප්‍රධානීන් අමාත්‍යාංශ වෙබ් අඩවියේ සඳහන් ප්‍රතිඵල ලේඛනවල අදාළ පිටපත් නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනුවලට ඇතුළත් කළ යුතු ය. ප්‍රතිඵල නැවත සමීක්ෂණයට අවසර දෙනු නොලැබේ.

16. මෙම විභාග නිවේදනයට විධිවිධාන සළසා නොමැති කවර කරුණක් පිළිබඳ වුව ද, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

17. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යයන්ගෙන් පළවන නිවේදනයන්හි පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් පවතී නම්, එවැනි විටෙක දී සිංහල මාධ්‍ය නිවේදනය බලාත්මක වේ.

ජේ. ජේ. රත්නසිරි,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය.

2016ක් වූ අගෝස්තු මස 26 වැනි දින,
කොළඹ 07,
නිදහස් චතුරශ්‍රය,
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ දී ය.

09-478

---

## ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව

### ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවා ගණයේ වැඩ පරීක්ෂක තනතුරෙහි III වන ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2016

මෙම දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවා ගණයේ වැඩ පරීක්ෂක තනතුරෙහි III වන ශ්‍රේණියේ එක් තනතුරක් සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපිටම ප්‍රයෝජනයට ගනිමින් පහත උපදෙස් අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර ආහාර කොමසාරිස්, ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව, අංක 330, යූනියන් පෙදෙස, කොළඹ 02 වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. කවරයේ වම්පස උඩ කෙළවරේ ''වැඩ පරීක්ෂක තනතුරෙහි III වැනි ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය'' යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය.

(*අ*) අයදුම්පත් කැඳවන අවසාන දිනය 2016 සැප්තැම්බර් මස 30 වන දින වේ.

සටහන.-ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරු විසින් ම විඳදරාගත යුතු ය. :

1. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය* :
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින්ගෙන් එක් අයෙකු, වැඩ පරීක්ෂක III වන ශ්‍රේණියේ තනතුර සඳහා පත් කිරීමට තෝරාගනු ඇත.

2. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුපට දායක මුදල් ගෙවිය යුතු ය.

(ii) මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරින් වසර (03) ක පරිවාස කාලයකට යටත් වන අතර, එම වසර (03) ඇතුළත පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුතුය.

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 අනුව වසර 05ක් තුළ දී 11 ඛණ්ඩයට අයත් දෙවන රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීනතා මට්ටම ලබා ගත යුතුය.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති වලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, මුදල් රෙගුලාසි වලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝග වලට ද මෙම පත්වීම යටත් වේ.

3. වැටුප් පරිමාණය :

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 දරන වැටුප් චක්‍රලේඛයට අනුව MN 3 -2016 යටතේ රු. 31,040-10 x 445-11x 660-10 x 730-10 x 750 - රු. 57,550ක (මාසික) වැටුප් පරිමාණයක් හිමිවේ.

4. i. අධ්‍යාපන සුදුසුකම් :

1. භෞතික විද්‍යාව සහ රසායන විද්‍යාව විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විද්‍යා/ගණිත විෂය ධාරාවන්ට අයත් විෂයයන් තුනකින් අ.පො.ස. (උ.පෙ.) විභාගය එකවර සමත් වී තිබීම;

හා

2. සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් 06කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය එකවර සමත්ව තිබීම;

4. ii. වෘත්තීය සුදුසුකම් :

1. මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව;

හෝ

2. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව;

හෝ

3. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව;

හෝ

4. ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව;

හෝ

5. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ 1 වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම;

හෝ

6. රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

හෝ

7. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියළු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

5. වයස් සීමාව :

අයදුම් පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නො අඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතු ය.

6. කායික සුදුසුකම් :

සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

7. වෙනත් සුදුසුකම් :

(i) අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය.
(ii) යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.
(iii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් සම්පූර්ණ කළයුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ /*ගැසට්* පත්‍රයේ සඳහන් කරනු ලබන අවසන් දිනට එම සුදුසුකම් සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

8. ලිඛිත විභාගය :

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *කාලය පැය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* | *විෂය නිර්දේශය* |
|---|---|---|---|---|
| 1. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 3 | 100 | 40% | ගොඩනැගිලි ඉදිකිරීම, සැළසුම් සකස් කිරීම, නඩත්තු (වායු සමීකරණ, ජලනල, විදුලිය) පිඹුරුපත් කියවීම, වැඩ බිමක සේවක කළමනාකරණය පිළිබඳ මූලික සංකල්ප |
| 2. බුද්ධි පරීක්ෂණය | පැය 1 | 100 | 40% | සාමාන්‍ය දැනීම |

8. (i) *සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය*.-ලකුණු ලබා දෙනු නොලැබේ. සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පමණක් පැවැත්වේ.

9. විභාග කොන්දේසි :

(i) විධිමත් ලෙස අයදුම්පත් එවා ඇති අපේක්ෂක/ අපේක්ෂිකාවන්ට කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ප්‍රවේශ පත්‍රනිකුත් කරනු ඇත. අපේක්ෂකයෙකු / අපේක්ෂිකාවක

තමාට නියමිත මධ්‍යස්ථානයේදී විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන කිසිඳු අයදුම්කරුවෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ii) මෙම විභාගයට පෙනී සිටීම වෙනුවෙන් අපේක්ෂක / අපේක්ෂිකාවන්ට දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් කිසිඳු දීමනාවක් ගෙවනු නොලැබේ.

(iii) තමා පෙනී සිටින සෑම විෂයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේදී තම අනන්‍යතාවය ඔප්පු කල යුතුය. මේ සඳහා

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව නිකුත් කළ ජාතික හැඳුනුම්පත; හෝ

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ පමණක් පිළිගැනේ.

(iv) විභාගය සිංහල,දෙමළ හා ඉංග්‍රීසි යන මාධ්‍ය තුනෙන්ම පවත්වනු ලැබේ. ඉල්ලුම් කරන ලද මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(v) අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත ගාස්තු ගෙවා නියමිත දිනට හෝ ඊට පෙර ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කර ඇති සියලුම අයදුම්කරුවන්ට තරඟ විභාගයට පෙනී සිටීමට ආහාර කොමසාරිස් විසින් ඉඩ දෙනු ලැබේ. තරඟ විභාගයට පෙනී සිටීම සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

(vi) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ.

(vii) මෙම විභාගය කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ පරීක්ෂණ හා ඇගයීම් අංශය විසින් කොළඹ විභාග මධ්‍යස්ථාන වලදී පමණක් පවත්වනු ලැබේ.

10. *අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය* :

(i) ආදර්ශ අයදුම්පත්‍රය ඒ 4 (සෙ.මී.24X29)ප්‍රමාණයේ කඩදාසි භාවිත කරමින්,අංක 01 සිට 04 තෙක් ඡේද පළමු පිටුවට ද, අංක 05 සිට ඉදිරියට වන ඡේද අනෙක් පිටුවලටද ඇතුළත් වන සේ සකස් කර තම අත් අකුරින්ම නිසි ලෙස සම්පූර්ණ කළ යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රිසියෙන්ද ,දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රිසියෙන්ද,සඳහන් කළ යුතුය.

(iii) ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූළ නොවන හා අසම්පූර්ණ තොරතුරු සහිත අයදුම්පත් සහ භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් පිළිගනු නොලැබේ. තැපැල් මාර්ගයෙන් එවීමේ දී සිදුවන ප්‍රමාදයන් වලක්වා ගැනීම සඳහා කල්වේලා ඇතිව ඉල්ලුම්පත් තැපැල් කිරීමට අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

(iv) විභාගයට පෙනී සිටින මාධ්‍යයෙන් අයදුම්පත සම්පූර්ණ කළ යුතුය.

(v) විභාග ගාස්තුව රු.500/-කි.එම විභාග ගාස්තුව,ආහාර කොමසාරිස් නමින් ලංකා බැංකුවේ යූනියන් පෙදෙස ශාඛාවේ ගිණුම් අංක 7042667 ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් ගෙවා ලබා ගන්නා ලද රිසිට්පත නොගැලවෙන සේ ඇලවිය යුතුය. ඔබගේ අයදුම්පත්‍රයේ සහ රිසිට්පතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.කිසිඳු හේතුවක් මත විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර මුදල් ඇණවුම් හෝ මුද්දර භාර ගනු නොලැබේ.

(vi) සෑම අයදුම්කරුවෙකුම තම අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු,කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු , සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලය ලත් නිලධාරිවරයෙකු,පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු,වාර්ෂික වැටුප රු.240,360/- ක් හෝ ඊට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයෙකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

(vii) රජයේ හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි නියුතු අයදුම්කරුවන් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

(viii) අයදුම්පත්‍රයෙහි සඳහන් කර ඇති යම් තොරතුරක් අසත්‍ය බව අනාවරණය වුවහොත් සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

11. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුත්තේය.

12. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධයෙන් අවසාන තීරණය ලබාදීම ආහාර කොමසාරිස් සතුවේ.සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට් පත්‍රයේ* සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

ජේ.ක්‍රිෂ්ණමූර්ති,
ආහාර කොමසාරිස්.

2016 සැප්තැම්බර් මස 09 වැනි දින.
ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව,
අංක 330,
යූනියන් පෙදෙස,
කොළඹ 02.

ආදර්ශ අයදුම් පත්‍රය
ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවා ගණයේ
වැඩ පරීක්ෂක තනතුරෙහි III වන ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2016

Open Competitive Examination for the Recruitment of Supervisory Management Assistant (Technical Service Category) Inspector of Works Grade III of Food Commissioner's Department - 2016

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

■ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ යොදන්න)

1.0

1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :———.
(*උදා* : HERATH MUDIYANSELAGE SAMAN KUMARA HERATH )

1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ) :———.
(*උදා* : HERATH H.M.S.K )

1.3 සම්පූර්ණ නම :———.
(සිංහලෙන් /දෙමළෙන්)

1.4 ජාතික හැඳුනුම්පත් අංකය :

2.0

2.1 ස්ථිර ලිපිනය :———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 ස්ථිර ලිපිනය :———.
(සිංහලෙන් /දෙමළෙන්)

2.3 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.0

3.1 ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ - 0
ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4.0

4.1 උපන් දිනය :

අවුරුද්ද : මාසය : දිනය :

4.2 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :

අවුරුදු : මාස : දින :

5.0 *අධ්‍යාපන සුදුසුකම්* :

5.1 අ.පො.ස.(සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර :
(i) විභාගයේ වර්ෂය හා මාසය :———.
(ii) විභාග අංකය :———.
(iii) ප්‍රතිඵල :———.

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1 | | 6 | |
| 2 | | 7 | |
| 3 | | 8 | |
| 4 | | 9 | |
| 5 | | 10 | |

5.2 අ.පො.ස(උ.පෙළ)විභාගය පිළිබඳ විස්තර :

(i) විභාගයේ වර්ෂය හා මාසය :———.
(ii) විභාග අංකය :———.
(iii) ප්‍රතිඵල :———.

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1 | | 3 | |
| 2 | | 4 | |

5.3 පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් ලබා ඇත්නම් :

(i) විශ්වවිද්‍යාලය :———.
(ii) උපාධිය :———.
(iii) විභාග අංකය :———.

6.0 වෘත්තීය සුදුසුකම් :
(i) ———.
(ii) ———.

7.0 *පළපුරුද්ද* :———.

8.0 ඔබ කවදාක හෝ කවර චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ?

■ (අදාළ කොටුවේ √ ලකුණ යොදන්න)

ඔව් නැත

(ඔව් නම් විස්තර සඳහන් කරන්න.)

9.0 විභාග ගාස්තු ගෙවූ රිසිට්පත පිළිබඳ විස්තර ‍:

(i) විභාග ගාස්තුව ගෙවන ලද ලංකා බැංකු ශාඛාව :———.

(ii) ගෙවූ මුදල රු. :———.

| විභාග ගාස්තු ගෙවූ රිසිට්පත නොගැලවෙන සේ මෙහි අලවන්න. (රිසිට් පතේ ඡායා පිටපත් ළඟ තබා ගන්න.) |
|---|

10.0 අයදුම්කරුගේ සහතිකය ‍:

(*අ*) මෙම ඉල්ලුම් පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ /හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තව ද මෙහි සියළුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(*ආ*) මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් ,පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව පත්වීම් ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද දනිමි.

(*ඇ*) තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීති රීති වලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

(*ඈ*) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

11.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම ‍:

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .............................. මහතා මහත්මිය/මෙනවිය/මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම රිසිට්පත අයදුම්පතෙහි අලවා ඇති බවත්, ඔහු/ඇය මා ඉදිරිපිට දී ............... වැනි දින ඔහුගේ /ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

———,
සහතික කරන නිලධාරියාගේ අත්සන

දිනය :———.
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :———.
තනතුර :———.
ලිපිනය :———.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

12.0 රාජ්‍ය සේවකයෙකු නම් දෙපාර්තමේන්තු /ආයතන ප්‍රධානියාගේ සහතිකය:

මෙම ඉල්ලුම්කරු වන ..................................... මයා/මිය/මෙය මෙම අමාත්‍යාංශ යේ/දෙපාර්තමේන්තුවේ/පළාත් සභාවේ/ආයතනයේ ස්ථිර/අනියම්/තාවකාලික නිලධාරියකු/නිලධාරිනියක ලෙස සේවය කරන බවත්, මෙම තනතුර සඳහා ඔහු/ඇය තෝරා ගනු ලැබුවහොත් දැනට දරන තනතුරින් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

———,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
හෝ බලය පැවරූ නිලධාරියාගේ
අත්සන.

දිනය :———.
සම්පූර්ණ නම :———.
තනතුර :———.
ලිපිනය :———.
(නිලමුද්‍රාව තබා සහතික කළ යුතුය.)

09-435

---

## අධ්‍යාපන අමාත්‍යාංශය

### ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල පවත්වනු ලබන තුන් අවුරුදු පූර්වසේවා ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාවක් හැදෑරීම සඳහා ශික්ෂණලාභීන් ඇතුළත් කර ගැනීම - 2016

1.0 ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක තුන් අවුරුදු පූර්වසේවා ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාවක් හැදෑරීම සඳහා බඳවා ගැනීම පිණිස අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් හා යෝග්‍යතාවය ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1.1 තමන් අයදුම් කරන පාඨමාලාවන් යටතේ *ගැසට් නිවේදනයේ* සඳහන් සියලු කරුණු දැඩි අවධානයෙන් කියවා, අවබෝධ කර ගැනීමේ වගකීම සෑම අයදුම්කරුවකු ම සතු වේ.

1.2 *ගැසට්* නිවේදනයේ "අයදුම්පත පිළියෙල කිරීම සඳහා උපදෙස්" තීරුවේ 7.0, 7.1 හා 7.2 යටතේ සඳහන් කර ඇති එක් එක් පාඨමාලාව සඳහා බඳවා ගනු ලබන අයදුම්කරුවන් සංඛ්‍යාව පිළිබඳ ව විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

2.0 **යෝග්‍යතාවය**

සෑම අයදුම්කරුවකු ම -

2.1 ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.

2.2 විශිෂ්ට චරිතයකින් ද, මනා ශාරීරික හා මානසික සෞඛ්‍යයෙන් ද යුක්ත විය යුතු ය.

2.3 වයස ඃ

2.3.1 2016.01.01 දිනට වයස අවුරුදු 25ට නොවැඩි විය යුතු ය.

2.3.2 බුද්ධ ධර්මය, කතෝලික ධර්මය ක්‍රිස්තියානි ධර්මය පාඨමාලාවලට අයදුම් කරන පූජ්‍ය පක්ෂය/ පූජක පක්ෂය 2016.01.01 දිනට වයස අවුරුදු 30ට නොවැඩි විය යුතු ය.

2.4 අවිවාහක විය යුතු ය.

3.0 **මූලික අධ්‍යාපන සුදුසුකම් ඃ**

- එක් එක් පාඨමාලා සඳහා විශේෂයෙන් දක්වා ඇති අවස්ථා හැර මෙම ඡේදයේ දැක්වෙන සුදුසුකම් අනිවාර්ය අධ්‍යාපන සුදුසුකම් වේ.

3.1 2014 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී විෂය තුනකින් (03) (ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට අයදුම් කරන වතු සේවකයන්ගේ දරුවන් පමණක් විෂය දෙකකින් (02)) එකවර සමත් වීම.

3.2 අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී මව්බස (සිංහල භාෂාව/ දෙමළ භාෂාව), ගණිතය ඇතුළු ව දෙවරකට නොවැඩි වාර ගණනක දී සම්මාන සාමර්ථ්‍ය තුනක් (03) සහිත ව, ප්‍රධාන විෂය හයකින් (06) සමත්වීම/මූලික පිරිවෙන් අවසාන විභාග යේ දී ගණිතය, සිංහල භාෂාව ඇතුළු ව අනිවාර්ය විෂය හයෙන් (06) දෙවරකට නොවැඩි වාර ගණනක දී සම්මාන සාමර්ථ්‍ය තුනක් (03) සහිත ව සමත් වීම (පළමු අවස්ථාවේ දී අවම වශයෙන් ප්‍රධාන විෂය පහකින් (05) සමත් වීම අත්‍යවශ්‍ය වේ).

***සැලකිය යුතු යි ඃ***
මෙහි දී අ.පො.ස. (සා/පෙළ) විභාගයේ 2008 නව නිර්දේශය අනුව හා ඊට පෙර ක්‍රියාත්මක වූ පැරණි නිර්දේශය අනුව පහත සඳහන් විෂය ප්‍රධාන විෂය ලෙස සලකනු ලැබේ.

2008 - අ.පො.ස (සා.පෙළ) නව නිර්දේශය යටතේ සලකා බලනු ලබන ප්‍රධාන විෂය ඃ-

(i) ආගම (ii) සිංහල භාෂාව හා සාහිත්‍යය / දෙමළ භාෂාව හා සාහිත්‍යය (iii) ඉංග්‍රීසි භාෂාව (iv) ගණිතය (v) ඉතිහාසය (vi) විද්‍යාව (vii) පළමුවන හෝ තෙවන විෂය කාණ්ඩයේ විෂය අතුරින් ඕනෑ ම විෂයයක් (viii) දෙවන විෂය කාණ්ඩයේ විෂය අතුරින් ඕනෑ ම විෂයයක්.

2008 වර්ෂයට පෙර ක්‍රියාත්මක වූ අ.පො.ස (සා.පෙළ) පැරණි නිර්දේශය යටතේ සලකා බලනු ලබන ප්‍රධාන විෂය ඃ-
(i) ආගම (ii) සිංහල භාෂාව හා සාහිත්‍යය/ දෙමළ භාෂාව හා සාහිත්‍යය (iii) ඉංග්‍රීසි භාෂාව (iv) ගණිතය (v) විද්‍යාව හා තාක්ෂණවේදය (vi) සමාජ අධ්‍යයනය හා ඉතිහාසය (vii) සෞන්දර්ය විෂය අතුරින් ඕනෑ ම විෂයයක් (viii) තාක්ෂණ විෂය අතුරින් ඕනෑ ම විෂයයක්

මූලික පිරිවෙන් අවසාන විභාගයේ අනිවාර්ය විෂය - (i) සිංහල (ii) පාලි (iii) සංස්කෘත (iv) ඉංග්‍රීසි (v) ගණිතය (vi) ත්‍රිපිටක ධර්මය

3.3 එක් එක් පාඨමාලාවට අදාළ වන අ.පො.ස. (සා. පෙළ) විභාගයේ විශේෂ සුදුසුකම් ඉහත 3.2 හි සඳහන් පරිදි දෙවරක දී සම්පූර්ණ නොවේ නම් තුන්වැනි වාරයේ දී සම්පූර්ණ කර තිබිය යුතු ය. (විශේෂ සුදුසුකම් පිළිබඳ ව සලකා බලනු ලබන්නේ 3.1 හා 3.2හි සඳහන් මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සඳහා පමණි.)

3.4 ඉංග්‍රීසි මාධ්‍ය පාඨමාලා සඳහා ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව :

3.4.1 ඉංග්‍රීසි භාෂාව පාඨමාලාව හැර ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වෙන අනෙකුත් පාඨමාලාවලට ඉල්ලුම් කරන අයදුම්කරුවන් අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව විෂයයට සම්මාන සාමර්ථ්‍යයක් / ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට සාමාන්‍ය සාමර්ථ්‍යයක් ලබා තිබිය යුතු වේ.

3.4.2 තොරතුරු සන්නිවේදන තාක්ෂණය හා බටහිර සංගීතය යන පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වුව ද, සිංහල හා දෙමළ මාධ්‍ය පාසල්වල පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව පදනම් කර ගෙන සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් අ.පො.ස. (උ. පෙළ) හැදෑරූ සිසුන් අතරින් බඳවා ගනු ලැබේ.

3.5 චිත්‍ර/ නැටුම් (පෙරදිග)/ නැටුම් (භරත)/ සංගීතය (පෙරදිග)/ සංගීතය (කර්ණාටක)/ නාට්‍ය හා රංගකලාව යන පාඨමාලා සඳහා සම්මුඛ පරීක්ෂණයට කැඳවන අයදුම්කරුවන් පහත සඳහන් පරිදි ශ්‍රේණිගත කර තෝරා ගනු ලැබේ.

- අයදුම්කරුවන් ඉල්ලුම් කරන ලද සෞන්දර්ය විෂයය සඳහා අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී ලබා ඇති ශ්‍රේණිය අනුව පෙළගස්වනු ලබන අතර එහි ප්‍රමුඛතා අනුපිළිවෙළ සකස් කරනුයේ ඔවුන් අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී ලබා ඇති Z අගය පදනම් කර ගනිමිනි. ඒ අනුව, ඉහළ Z අගයයක් සහිත ව ඉහළ ම ශ්‍රේණියක් අදාළ සෞන්දර්ය විෂයයට හිමිකරගත් අයදුම්කරුවන්ට (අනෙකුත් බඳවා ගැනීමේ නිර්ණායකවලට අනුගත ව) ප්‍රමුඛතාවය හිමි වේ.

3.6 සුදුසුකම් තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කරන සියලුම අධ්‍යාපන/ වෘත්තීය සහතිකවල වලංගු දිනය ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පෙර දිනයක් විය යුතු ය.

4.0 **එක් එක් පාඨමාලා සඳහා සුදුසුකම් :**

ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල පැවැත්වෙන එක් එක් පාඨමාලාවට බඳවා ගැනීම සඳහා අදාළ අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් විශේෂ සුදුසුකම් පහත දැක්වේ :-

**4.1 පාඨමාලා අංකය 01 - ප්‍රාථමික අධ්‍යාපනය (සිංහල)**
**ප්‍රාථමික අධ්‍යාපනය (දෙමළ)**

4.1.1 2014 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයට කලා විෂයධාරාවෙන් පෙනී සිට සිංහල/දෙමළ භාෂාව විෂයය සහිත ව විෂය තුනකින් (03) (ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට අයදුම් කරන වතු සේවකයන්ගේ දරුවන් පමණක් සිංහල/දෙමළ භාෂාව විෂයය ඇතුළු ව අදාළ විෂය දෙකකින් (02)) සමත්වීම ;

*හා*

අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී සිංහල/දෙමළ භාෂාව හා ගණිතය යන විෂය සඳහා සම්මාන සාමර්ථ්‍යය සහිත ව ඉංග්‍රීසි භාෂාව ද ඇතුළු ව ප්‍රධාන විෂය හයකින් (06) සමත් වීම ;

*හෝ*

4.1.2

4.1.2.1. 2014 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී සිංහල/ දෙමළ භාෂාව විෂයය රහිත ව කලා විෂයධාරාව හදාරා විෂය තුනකින් (03) (ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට අයදුම් කරන වතු සේවකයන්ගේ දරුවන් පමණක් අදාළ විෂය දෙකකින් (02)) සමත් වීම ;

*හෝ*

4.1.2.2. 2014 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී වාණිජ/ විද්‍යා (භෞතීය විද්‍යා/ජීව විද්‍යා)/ වෙනත් විෂයධාරාවක් හදාරා විෂය තුනකින් (03) (ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට අයදුම් කරන වතු සේවකයන්ගේ දරුවන් පමණක් අදාළ විෂය දෙකකින් (02)) සමත් වීම ;

*හා*

අ.පො.ස. (සා. පෙළ) විභාගයේ සිංහල/ දෙමළ භාෂාව විෂයය සඳහා විශිෂ්ට සාමර්ථ්‍යයක් ද, ගණිතය සඳහා සම්මාන සාමර්ථ්‍යයක් ද සහිත ව, ඉංග්‍රීසි භාෂාව ඇතුළු ව ප්‍රධාන විෂය හයකින් (06) සමත් වීම.

*සැලකිය යුතු යි :*

(i) බඳවා ගැනීමේ දී අ.පො.ස. (උ. පෙළ) විභාගයට පෙනී සිට කලා විෂය ධාරාවෙන් සිංහල/ දෙමළ භාෂාව විෂයයක් ලෙස හැදෑරූ අයදුම්කරුවන්ගෙන් 60%ක් ද,

(ii) අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී සිංහල/ දෙමළ භාෂාව විෂයයක් ලෙස හදාරා නොමැති කලා විෂයධාරාවේ අයදුම්කරුවන්ගෙන් 10%ක් සහ විද්‍යා (භෞතීය විද්‍යා/ජීව විද්‍යා), වාණිජ, වෙනත් විෂයධාරාවලින් 10% බැගින් ද, වන සේ තෝරාගනු ලැබේ.

| | |
|---|---|
| **4.2 පාඨමාලා අංකය 02 -** | **විද්‍යාව (සිංහල)**<br>**විද්‍යාව (දෙමළ)**<br>**විද්‍යාව (ඉංග්‍රීසි)** |

4.2.1 2014 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී භෞතික විද්‍යාව, රසායන විද්‍යාව සහ ජීව විද්‍යාව යන ජීව විද්‍යා විෂයධාරාවට අයත් විෂය තුනෙන් (03) (ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට අයදුම් කරන වතු සේවකයින්ගේ දරුවන් පමණක් ජීව විද්‍යාව විෂයය ඇතුළු ව ඉහත විෂය දෙකකින් (02)) සමත් වීම ;

හා

4.2.2 ගණිතය විෂයයට සම්මාන සාමර්ථ්‍යයක් සහිතව සිංහල/ දෙමළ භාෂාව ඇතුළු ව ප්‍රධාන විෂය හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වීම.

*සැලකිය යුතු යි :*

- *විද්‍යාව (ඉංග්‍රීසි මාධ්‍යය) පාඨමාලාව සඳහා*

  මෙම පාඨමාලාව සඳහා බඳවා ගන්නා මුළු ශිෂ්‍ය සංඛ්‍යාව, අ.පො.ස. (උ. පෙළ) ඉංග්‍රීසි මාධ්‍යයෙන් හැදෑරූ අයදුම්කරුවන්ගෙන් 60%ක් ද, ඉතිරි 40% සිංහල/ දෙමළ මාධ්‍යයෙන් අ.පො.ස. (උ. පෙළ) හැදෑරූ අයදුම්කරුවන්ගෙන් ද වන සේ බඳවා ගනු ලැබේ. (බඳවා ගැනීමේ දී ඉංග්‍රීසි මාධ්‍යයෙන් අ.පො.ස (උ. පෙළ) හැදෑරූ අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය හිමි වේ).

| | |
|---|---|
| **4.3 පාඨමාලා අංකය 03 -** | **ගණිතය (සිංහල)**<br>**ගණිතය (දෙමළ)**<br>**ගණිතය (ඉංග්‍රීසි)** |

4.3.1 2014 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී සංයුක්ත ගණිතය, උසස් ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව යන භෞතීය විද්‍යා විෂයධාරාවට අයත් විෂය තුනකින් (03) (ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට අයදුම් කරන වතු සේවකයන්ගේ දරුවන් පමණක් භෞතීය විද්‍යා විෂයධාරාවට අයත් සංයුක්ත ගණිතය හෝ උසස් ගණිතය යන විෂයය එකක් සහිත ව ඉහත විෂය දෙකකින් (02)) සමත් වීම ;

*හා*

4.3.2 විද්‍යාව/විද්‍යාව හා තාක්ෂණවේදය විෂයයට සම්මාන සාමර්ථ්‍යයක් සහිතව සිංහල/ දෙමළ භාෂාව ඇතුළු ව ප්‍රධාන විෂය හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වීම.

*සැලකිය යුතු යි :*

- *ගණිතය (ඉංග්‍රීසි මාධ්‍යය) පාඨමාලාව සඳහා*

  මෙම පාඨමාලාව සඳහා බඳවා ගන්නා මුළු ශිෂ්‍ය සංඛ්‍යාව, අ.පො.ස. (උ. පෙළ) ඉංග්‍රීසි මාධ්‍යයෙන් හැදෑරූ අයදුම්කරුවන්ගෙන් 60%ක් ද, ඉතිරි 40 % සිංහල/ දෙමළ මාධ්‍යයෙන් අ.පො.ස. (උ. පෙළ) හැදෑරූ අයදුම්කරුවන්ගෙන් ද වන සේ බඳවා ගනු ලැබේ. (බඳවා ගැනීමේ දී ඉංග්‍රීසි මාධ්‍යයෙන් අ.පො.ස. (උ. පෙළ) හැදෑරූ අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය හිමි වේ).

| |
|---|
| **4.4 පාඨමාලා අංකය 04 - සමාජීය විද්‍යාව (දෙමළ)** |

- (සමාජීය විද්‍යාව පාඨමාලාව පැවැත්වෙන්නේ ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ දෙමළ මාධ්‍යය සිසුන් සඳහා පමණි. එහෙයින් මෙම පාඨමාලාවට අයදුම් කළ හැක්කේ 6.3 ඡේදයේ සඳහන් අයදුම්කරුවන්ට පමණි.)

4.4.1 2014 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී ඉතිහාසය, දේශපාලන විද්‍යාව, භූගෝල විද්‍යාව යන විෂයන්ගෙන් එකක් ඇතුළු ව විෂය තුනකින් (03) (වතු සේවකයන්ගේ දරුවන් පමණක් ඉහත විෂයන්ගෙන් එකක් ඇතුළුව විෂය දෙකකින් (02)) සමත් වීම ;

*හා*

4.4.2 සමාජ අධ්‍යයනය හා ඉතිහාසය විෂයයට හෝ ඉතිහාසය/ පුරවැසි අධ්‍යාපනය/භූගෝල විද්‍යාව යන විෂයන්ගෙන් එක් විෂයයකට සම්මාන සාමර්ථ්‍යයක් සහිත ව දෙමළ භාෂාව හා ගණිතය ඇතුළු ව ප්‍රධාන විෂය හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වීම.

**4.5 පාඨමාලා අංකය 05 - බුද්ධ ධර්මය**

බුද්ධ ධර්මය පාඨමාලාවට බෞද්ධ භික්ෂූන් වහන්සේලාට ද, මෙහෙණින් වහන්සේලාට ද බුද්ධ ශාසන අමාත්‍යාංශය යටතේ ඇති බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි දසසිල් මාතාවන්ට ද, ගිහි අයදුම්කරුවන්ට ද ඉල්ලුම් කළ හැකිය. (ගිහි අයදුම්කරුවන්ගේ සියලුම අධ්‍යාපන සුදුසුකම් ගිහි නමින් ම සම්පූර්ණ කර තිබිය යුතු ය.)

4.5.1 2014 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී බුද්ධ ධර්මය, බෞද්ධ ශිෂ්ටාචාරය, පාලි හා සිංහල යන විෂයන්ගෙන් දෙකක් ඇතුළු ව විෂය තුනකින් (03) සමත් වීම.
4.5.2 සිංහල භාෂාව, බුද්ධ ධර්මය හා ගණිතය ඇතුළු ව ප්‍රධාන විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය / සිංහල භාෂාව, ගණිතය, ත්‍රිපිටක ධර්මය ඇතුළු අනිවාර්ය විෂය හයෙන් (06) මූලික පිරිවෙන් අවසාන විභාගය සමත් වීම.
4.5.3 ප්‍රාචීන, ප්‍රාරම්භ විභාගයෙන් සමත් වීම.
4.5.4 බෞද්ධ ධර්මාචාර්ය විභාගයෙන් සමත් වීම.
4.5.5 දහම් පාසල් අවසාන විභාගයෙන් සමත් වීම.

*සැලකිය යුතු යි :*

**තෝරා ගැනීමේ ප්‍රමුඛතා අනුපිළිවෙළ**

(අ) 4.5.1, 4.5.2, 4.5.3, 4.5.4, 4.5.5 යන සියලුම සහතික ඇති අයදුම්කරුවන්.
(ආ) 4.5.1, 4.5.2 සහ 4.5.3 සහතික ඇති අයදුම්කරුවන්.
(ඉ) 4.5.1, 4.5.2 සහ 4.5.4 සහතික ඇති අයදුම්කරුවන්.
(ඊ) 4.5.1, 4.5.2 සහ 4.5.5 සහතික ඇති අයදුම්කරුවන්.
(උ) 4.5.1 සහ 4.5.2 සහතික ඇති අයදුම්කරුවන්.

**4.6 පාඨමාලා අංකය 06 - හින්දු ධර්මය**

4.6.1 2014 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී හින්දු ධර්මය, හින්දු ශිෂ්ටාචාරය හා සංස්කෘත යන විෂයන්ගෙන් එකක් ඇතුළු ව විෂය තුනකින් (03) සමත් වීම.
4.6.2 දෙමළ භාෂාව, ගණිතය සහ හින්දු ධර්මය ඇතුළු ව ප්‍රධාන විෂය හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් සමත් වීම.
4.6.3 ශෛව සිද්ධාන්ත පණ්ඩිතර් සහතිකය ලබා තිබීම.
4.6.4 ශෛව පුලවර් සහතිකය ලබා තිබීම.
4.6.5 ඉලං ශෛව පුලවර් සහතිකය ලබා තිබීම.

*සැලකිය යුතුයි :*

**තෝරා ගැනීමේ ප්‍රමුඛතා අනුපිළිවෙළ**

(අ) 4.6.1, 4.6.2 සහ අනිකුත් සියලුම සහතික හිමි අයදුම්කරුවන්.
(ආ) 4.6.1, 4.6.2, 4.6.5 සහ අනිකුත් සහතික දෙකෙන් එකක් ලැබූ අයදුම්කරුවන්.
(ඉ) 4.6.1, 4.6.2 සහ අනිකුත් සහතික තුනෙන් එකක් ලැබූ අයදුම්කරුවන්.
(ඊ) 4.6.1, 4.6.2 සහතික ලැබූ අයදුම්කරුවන්.

**4.7 පාඨමාලා අංකය 07 - ඉස්ලාම් ධර්මය**

4.7.1 2014 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී ඉස්ලාම් ධර්මය, ඉස්ලාම් ශිෂ්ටාචාරය හා අරාබි යන විෂයන්ගෙන් එකක් ඇතුළු ව විෂය තුනකින් (03) සමත් වීම.
4.7.2 දෙමළ භාෂාව, ගණිතය සහ ඉස්ලාම් ධර්මය ඇතුළුව ප්‍රධාන විෂය හයකින් (06) අ. පො. ස. (සා. පෙ.) විභාගය සමත් වීම.
4.7.3 අල් - ආලිම් විභාගය (ප්‍රාථමික විභාගයේ සියලුම විෂයන්ගෙන් හා අවසාන විභාගයේ සියලුම විෂයන්ගෙන් යන දෙකෙන් ම) සමත් වීම.
4.7.4 අල් - ආලිම් ප්‍රාථමික විභාගයේ සියලුම විෂයන්ගෙන් සමත් වීම.
4.7.5 මෞලවි සහතිකය ලබා තිබීම.

සැලකිය යුතු යි ෘ

*තෝරා ගැනීමේ ප්‍රමුඛතා අනුපිළිවෙළ*

(*අ*) 4.7.1, 4.7.2, 4.7.3, 4.7.4 සහ 4.7.5 සහතික හිමි අයදුම්කරුවන්.

(*ආ*) 4.7.1, 4.7.2, 4.7.4 සහ 4.7.5 සහතික හිමි අයදුම්කරුවන්.

(*ඉ*) 4.7.1, 4.7.2 සහ 4.7.5 සහතික හිමි අයදුම්කරුවන්.

(*ඊ*) 4.7.1 සහ 4.7.2 සහතික හිමි අයදුම්කරුවන්.

**4.8 පාඨමාලා අංකය 08 - කතෝලික ධර්මය/ක්‍රිස්තියානි ධර්මය (සිංහල)**

**කතෝලික ධර්මය/ක්‍රිස්තියානි ධර්මය (දෙමළ)**

4.8.1 2014 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී ඕනෑ ම විෂය තුනකින් (03) සමත් වීම ;

*හා*

සිංහල/ දෙමළ භාෂාව, ගණිතය ඇතුළු ව ප්‍රධාන විෂය හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වීම ;

*හා*

අ.පො.ස. (උ. පෙළ) විභාගයෙන් ක්‍රිස්තු ධර්මය/ ක්‍රිස්තියානි ධර්මය/ ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය විෂයයට සාමාන්‍ය සාමර්ථ්‍යයක් *හෝ* අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් කතෝලික ධර්මය/ ක්‍රිස්තියානි ධර්මය විෂයයට සම්මාන සාමර්ථ්‍යයක්;

*හා*

අයදුම්කරු කතෝලික ධර්මය/ ක්‍රිස්තියානි ධර්මය ගුරුවරයෙකු වීමට සුදුසු බවට කතෝලික ආගමිකයන් සඳහා කතෝලික රදගුරු පදවි සහතිකය ද, ක්‍රිස්තියානි ආගමිකයන් සඳහා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයේ සහතිකය ද ලබා තිබීම.

4.8.2 කතෝලික ධර්මය අයදුම්කරුවන් තෝරා ගැනීම පහත දැක්වෙන සුදුසුකම්වලට අනුපිළිවෙළින් ප්‍රමුඛත්වය දී සිදු කරනු ලැබේ.

4.8.2.1 ජාතික දෙව්සත්හලේ දේවධර්මය පිළිබඳ සිව් අවුරුදු පාඨමාලා සහතිකය ;

*හෝ*

4.8.2.2 ජාතික දෙව්සත්හලේ දර්ශනවාදය පිළිබඳ පාඨමාලා සහතිකය ;

*හෝ*

4.8.2.3 දේවධර්ම නිකේතනයේ තුන් අවුරුදු ආගමික අධ්‍යයන පාඨමාලා සහතිකය ;

*හෝ*

4.8.2.4 පැවිදිවරයකු/ පැවිදිවරියක වීම සඳහා ආගමික අධ්‍යයන සහ පුහුණු පාඨමාලාව (නොවිෂියේට්) සාර්ථක ව හදාරා අවසන් කළ බවට පැවිදි නිකායන්ගේ ශ්‍රේෂ්ඨාධිපති/ ශ්‍රේෂ්ඨාධිපතිනිය හෝ අදාළ රදගුරුතුමන් විසින් නිකුත් කරන ලද සහතිකය;

*හෝ*

4.8.2.5 ජාතික ධර්මෝපදේශක මධ්‍යස්ථානය විසින් පවත්වනු ලබන කතෝලික ධර්මාචාර්ය (දහම් ගුරු) විභාගයක් සමත් වීම;
එනම්,

ධර්මාචාර්ය ගෞරව (දහම් ගුරු 03)

*හෝ*

ධර්මාචාර්ය විශේෂ (දහම් ගුරු 02)

*හෝ*

ධර්මාචාර්ය සාමාන්‍ය (දහම් ගුරු 01)

*හෝ*

4.8.2.6 අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී ක්‍රිස්තු ධර්මය/ ක්‍රිස්තියානි ධර්මය/ ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය විෂයය සමත් වීම.

4.8.3 ක්‍රිස්තු ධර්මය අයදුම්කරුවන් තෝරා ගැනීම අනුපිළිවෙළින් පහත දැක්වෙන සුදුසුකම් අනුව සිදු කරනු ලැබේ ;

4.8.3.1 පිළිමතලාව ලංකා දේවධර්ම ශාස්ත්‍රාලය මගින් පවත්වනු ලබන ධර්මවේදී ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම ;

4.8.3.2 ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය මගින් පවත්වනු ලබන ආගමික දැනුම පිළිබඳ ජාතික සහතිකය (ධර්මාචාර්ය) ලබා තිබීම.

**සැලකිය යුතු යි :**

(i) කතෝලික/ ක්‍රිස්තියානි ධර්මය (සිංහල මාධ්‍ය) පාඨමාලාවට තෝරා ගැනීමේ දී එක් එක් දිස්ත්‍රික්කවල වෙසෙන කතෝලික ජනගහනය පදනම් කර ගනිමින්, ඒ ඒ දිස්ත්‍රික්කයේ අයදුම්කරුවන්ගේ Z ලකුණු කුසලතා අනුපිළිවෙළට තෝරා ගනු ලැබේ.

(ii) බඳවා ගන්නා මුළු සංඛ්‍යාවෙන් 85%ක් තෝරා ගැනීම සඳහා 4.8.1 යටතේ සුදුසුකම් ලබන කතෝලික අයදුම්කරුවන් අතරින් 4.8.2 යටතේ දැක්වෙන අනුපිළිවෙළ අනුව තෝරාගනු ලැබේ. 85% ක් කතෝලික අයදුම්කරුවන් ඉදිරිපත් වී නොමැති නම් එම පුරප්පාඩු සඳහා ක්‍රිස්තියානි අයදුම්කරුවන් තෝරා ගනු ලැබේ.

(iii) බඳවා ගන්නා මුළු සංඛ්‍යාවෙන් 15%ක් 4.8.1 යටතේ සුදුසුකම් ලබන ක්‍රිස්තු ධර්මය අයදුම්කරුවන් අතරින් 4.8.3 යටතේ දැක්වෙන අනුපිළිවෙළ අනුව තෝරා ගනු ලැබේ. 15%ක් ක්‍රිස්තියානි අයදුම්කරුවන් ඉදිරිපත් වී නොමැති නම් එම පුරප්පාඩු සඳහා කතෝලික අයදුම්කරුවන් තෝරා ගනු ලැබේ.

(iv) බඳවා ගන්නා මුළු අයදුම්කරුවන් සංඛ්‍යාවෙන් 40%ක් කතෝලික හා ක්‍රිස්තියානි පූජක පක්ෂයෙන් තෝරා ගනු ලැබේ. 40%ක පූජක පක්ෂයේ අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් වී නොමැති නම් එම පුරප්පාඩු සඳහා ගිහි අයදුම්කරුවන් තෝරා ගනු ලැබේ.

(v) පූජක පක්ෂයේ අයදුම්කරුවන් අතර 2014 වර්ෂයේ අ.පො.ස. (උ. පෙළ) සමත් වූ අයදුම්කරුවන් අවශ්‍ය සංඛ්‍යාව නොමැති නම් 2013, 2012, 2011, 2010 යන අනුපිළිවෙළින් ආසන්නතම වර්ෂය සලකා අ.පො.ස. (උ. පෙළ) සමත් වූ පූජක/ පැවිදි පක්ෂයේ අයදුම්කරුවන්ගෙන් තෝරා ගනු ලැබේ.

**4.9 පාඨමාලා අංකය 09 - පළමුබස (සිංහල)**

4.9.1 2014 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී සිංහල විෂයයට සම්මාන සාමාර්ථ්‍යයක් සහිතව විෂය තුනකින් (03) සමත් වීම ;

හා

4.9.2 සිංහල භාෂාව විෂයයට සම්මාන සාමර්ථ්‍යයක් සහිතව ගණිතය ඇතුළු ව ප්‍රධාන විෂය හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වීම.

**4.10 පාඨමාලා අංකය 10 - පළමුබස (දෙමළ)**

4.10.1 2014 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී දෙමළ විෂයයට සම්මාන සාමර්ථ්‍යයක් සහිතව විෂය තුනකින් (03) සමත් වීම (ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයට අයදුම්කරන වතු සේවකයන්ගේ දරුවන් පමණක් දෙමළ විෂයය ඇතුළු ව විෂය දෙකකින් (02) සමත් වීම ප්‍රමාණවත් වේ. ඒ අතුරින් අ.පො.ස. (උ. පෙළ) විභාගයෙන් දෙමළ විෂයයට සම්මාන සාමර්ථ්‍යයක් ලබා ඇති අයදුම්කරුවන්ට ප්‍රමුඛතාව හිමි වේ) ;

හා

4.10.2 දෙමළ භාෂාව විෂයයට සම්මාන සාමර්ථ්‍යයක් සහිතව ගණිතය ඇතුළු ව ප්‍රධාන විෂය හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වීම.

**4.11 පාඨමාලා අංකය 11 - ඉංග්‍රීසි**

4.11.1 2014 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව (විෂය අංකය 73) ඇතුළු ව විෂය තුනකින් (03) සමත් වීම ;

හා

අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව විෂයයට සම්මාන සාමර්ථ්‍යයක් / ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට සාමාන්‍ය සාමර්ථ්‍යයක් සහිතව,සිංහල/ දෙමළ භාෂාව හා ගණිතය ද ඇතුළු ව ප්‍රධාන විෂය හයකින් (06) සමත්වීම / ලන්ඩන් (සා. පෙළ) විභාගයෙන් සමත් වීම.

4.11.2 2014 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී ඕනෑ ම විෂය තුනකින් (03) සමත් වීම ;

හා

අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට අවම වශයෙන් සම්මාන සාමර්ථ්‍යයක් හා සිංහල/ දෙමළ භාෂාව, ගණිතය හා ඉංග්‍රීසි භාෂාව ද ඇතුළු ව ප්‍රධාන විෂය හයකින් (06) අ.පො.ස.(සා. පෙළ) විභාගය සමත් වීම ;

4.11.3 2014 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී ඕනෑ ම විෂය තුනකින් (3) සමත් වීම ;

හා

අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව විෂයයට අවම වශයෙන් අධි සම්මාන සාමර්ථ්‍යයක් හා සිංහල/ දෙමළ භාෂාව හා ගණිතය ද ඇතුළු ව ප්‍රධාන විෂය හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වීම.

*සැලකිය යුතු යි :*

**තෝරා ගැනීමේ ප්‍රමුඛතා අනුපිළිවෙළ**

(i) 4.11.1 යටතේ සුදුසුකම් සපුරන අයදුම්කරුවන් :
ඔවුන් තෝරා ගනු ලබන්නේ එක් එක් දිස්ත්‍රික්ක මට්ටමින්/ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ලබා ගත් Z ලකුණු කුසලතා අනුපිළිවෙළට සහ 6.1.2 ඡේදය අනුව වේ.

(ii) 4.11.2 යටතේ සුදුසුකම් සපුරන අයදුම්කරුවන් :

ඔවුන් තෝරා ගනු ලබන්නේ එක් එක් දිස්ත්‍රික්ක මට්ටමින්/ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට ලබා ගත් සාමර්ථ්‍යයේ ලකුණු අනුපිළිවෙලට සහ 6.1.2 ඡේදය අනුව වේ. (මෙහි දී සලකා බලනු ලබන්නේ විශිෂ්ට සාමර්ථ්‍යය - A, අධි සම්මාන සාමර්ථ්‍යය - B හා සම්මාන සාමර්ථ්‍යය - C පමණි).

(iii) 4.11.3 යටතේ සුදුසුකම් සපුරන අයදුම්කරුවන් :

ඔවුන් තෝරා ගනු ලබන්නේ එක් එක් දිස්ත්‍රික්ක මට්ටමින්/ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව විෂයයට ලබාගත් සාමාර්ථ්‍යයේ ලකුණු අනුපිළිවෙළට සහ 6.1.2 ඡේදය අනුව වේ. (මෙහි දී සලකා බලනු ලබන්නේ විශිෂ්ට සාමාර්ථ්‍යය - A හා අධි සම්මාන සාමර්ථ්‍යය - B පමණි).

**4.13 පාඨමාලා අංකය 13 - චිත්‍ර (සිංහල)**
**චිත්‍ර (දෙමළ)**

4.13.1 2014 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී චිත්‍ර කලාව විෂයය ඇතුළු ව විෂය තුනකින් (03) (ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට අයදුම් කරන වතු සේවකයන්ගේ දරුවන් පමණක් චිත්‍ර කලාව ඇතුළු ව විෂය දෙකකින් (02)) සමත් වීම ;

*හා*

4.13.2 සිංහල/ දෙමළ භාෂාව, ගණිතය හා චිත්‍ර ඇතුළු ව ප්‍රධාන විෂය හයකින් (06) අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත් වීම.

4.13.3 4.13.1 සහ 4.13.2 සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අතරින් 3.5 වගන්තියේ සඳහන් ක්‍රමවේදයට අනුව තෝරා ගැනීම් සිදු කරනු ලැබේ.

*සැලකිය යුතු යි :*

(ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සඳහා අදාළ සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති නම් 2014 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී චිත්‍ර කලාව විෂයය ඇතුළු ව විෂය තුනකින් (03) සමත් වතු දිස්ත්‍රික්කවල පදිංචි වතු සේවක නොවන ඉන්දියානු සම්භවයක් ඇති දෙමළ මාධ්‍ය අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය හිමි වේ. තවදුරටත් පුරප්පාඩු පවතී නම් වතු සේවක දරුවන්, 2014 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී එකවර විෂය දෙකකින් සමත් ව අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී චිත්‍ර/ චිත්‍ර හා මූර්ති විෂයයට සම්මාන සාමර්ථ්‍යයක් ලබා ඇති ඉල්ලුම්පත්‍ර ද සලකා බලනු ලැබේ).

**4.14 පාඨමාලා අංකය 14 - නැටුම් (පෙරදිග)**

4.14.1 2014 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී නැටුම් (පෙරදිග) විෂයය ඇතුළු ව විෂය තුනකින් (03) සමත් වීම ;

හා

4.14.2 සිංහල භාෂාව, ගණිතය හා නැටුම් (පෙරදිග) ඇතුළු ව ප්‍රධාන විෂය හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වීම.

4.14.3 4.14.1 හා 4.14.2 සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අතරින් 3.5 වගන්තියේ සඳහන් ක්‍රමවේදයට අනුව තෝරාගැනීම් සිදු කරනු ලැබේ.

**4.15 පාඨමාලා අංකය 15 - නැටුම් (භරත)**

4.15.1 2014 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී නැටුම් (භරත) ඇතුළු ව විෂය තුනකින් (03) (ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට අයදුම් කරන වතු සේවකයන්ගේ දරුවන් පමණක් නැටුම් (භරත) ඇතුළු ව විෂය දෙකකින් (02)) සමත් වීම ;

*හා*

4.15.2 දෙමළ භාෂාව, ගණිතය හා නැටුම් (භරත) ඇතුළු ව ප්‍රධාන විෂය හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වීම.

4.15.3 4.15.1 හා 4.15.2 සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අතරින් 3.5 වගන්තියේ සඳහන් ක්‍රමවේදයට අනුව තෝරා ගැනීම් සිදු කරනු ලැබේ.

**සැලකිය යුතු යි :**

(ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සඳහා අදාළ සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති නම් 2014 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී නැටුම් (භරත) විෂයය ඇතුළු ව විෂය තුනකින් (03) සමත් වතු දිස්ත්‍රික්කවල පදිංචි වතු සේවක නොවන ඉන්දියානු සම්භවයක් ඇති දෙමළ මාධ්‍ය අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය හිමි වේ. තවදුරටත් පුරප්පාඩු පවතී නම් වතු සේවක දරුවන්, 2014 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී එකවර විෂය දෙකකින් සමත් ව අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී නැටුම් (භරත) විෂයයට සම්මාන සාමර්ථ්‍යයක් ලබා ඇති ඉල්ලුම්පත්‍ර ද සලකා බලනු ලැබේ).

**4.16 පාඨමාලා අංකය 16 - සංගීතය (පෙරදිග)**

4.16.1 2014 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී සංගීතය (පෙරදිග) විෂයය ඇතුළු ව විෂය තුනකින් (03) සමත් වීම ;

හා

4.16.2 සිංහල භාෂාව, ගණිතය හා සංගීතය (පෙරදිග) ඇතුළු ව ප්‍රධාන විෂය හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වීම.

4.16.3 4.16.1 හා 4.16.2 සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අතරින් 3.5 වගන්තියේ සඳහන් ක්‍රමවේදයට අනුව තෝරා ගැනීම් සිදු කරනු ලැබේ.

**4.17 පාඨමාලා අංකය 17 - සංගීතය (කර්ණාටක)**

4.17.1 2014 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී සංගීතය (කර්ණාටක) ඇතුළු ව විෂය තුනකින් (03) (ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට අයදුම් කරන වතු සේවකයන්ගේ දරුවන් පමණක් සංගීතය (කර්ණාටක) ඇතුළු ව විෂය දෙකකින් (02)) සමත් වීම ;

*හා*

4.17.2 දෙමළ භාෂාව, ගණිතය හා සංගීතය (කර්ණාටක) ඇතුළු ව ප්‍රධාන විෂය හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වීම.

4.17.3 4.17.1 හා 4.17.2 සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අතරින් 3.5 වගන්තියේ සඳහන් ක්‍රමවේදයට අනුව තෝරා ගැනීම් සිදු කරනු ලැබේ.

***සැලකිය යුතු යි :***

(ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සඳහා අදාළ සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති නම් 2014 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී සංගීතය (කර්ණාටක) විෂයය ඇතුළු ව විෂය තුනකින් (03) සමත් වතු දිස්ත්‍රික්කවලට අයත් වතු සේවක නොවන ඉන්දියානු සම්භවයක් ඇති දෙමළ මාධ්‍ය අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය හිමි වේ. තවදුරටත් පුරප්පාඩු පවතී නම් වතු සේවකයන්ගේ දරුවන්, 2014 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී එකවර විෂයයන් දෙකකින් සමත් ව අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී සංගීතය (කර්ණාටක) විෂයයට සම්මාන සාමර්ථ්‍යයක් ලබා ඇති ඉල්ලුම් පත්‍ර සලකා බලනු ලැබේ).

**4.18 පාඨමාලා අංකය 18 - බටහිර සංගීතය (ඉංග්‍රීසි)**

4.18.1 2014 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී බටහිර සංගීතය ඇතුළු ව විෂය තුනකින් (03) සමත් වීම ;

*හා*

ඉංග්‍රීසි භාෂාව විෂයයට සම්මාන සාමර්ථ්‍යයක්/ ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට සාමාන්‍ය සාමර්ථ්‍යයක් ද සහිත ව සිංහල/ දෙමළ භාෂාව, ගණිතය සහ බටහිර සංගීතය ඇතුළු ව ප්‍රධාන විෂය හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වීම ;

*හෝ*

4.18.2 2014 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී ඕනෑ ම විෂය තුනකින් (03) සමත් වීම ;

*හා*

ඉංග්‍රීසි භාෂාව විෂයයට සම්මාන සාමර්ථ්‍යයක් / ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට සාමාන්‍ය සාමර්ථ්‍යයක් ද සහිතව සිංහල/ දෙමළ භාෂාව, ගණිතය සහ බටහිර සංගීතය ඇතුළු ව ප්‍රධාන විෂය හයකින් (06) අ.පො. ස. (සා. පෙළ) විභාගය සමත් වීම;

*හා*

අධ්‍යාපන විද්‍යායතන මණ්ඩලය/අධ්‍යාපන ලේකම් විසින් අනුමත කරන ලද ආයතනයක බටහිර සංගීතය පිළිබඳ ව පස්වැනි පන්තිය සමත් වීම (න්‍යායික හා ප්‍රායෝගික) ;

*හෝ*

4.18.3 2014 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී ඕනෑ ම විෂය තුනකින් (03) සමත් වීම;

*හා*

ඉංග්‍රීසි භාෂාව විෂයයට සම්මාන සාමර්ථ්‍යයක්/ ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට සාමාන්‍ය සාමර්ථ්‍යයක් ද සහිතව සිංහල/ දෙමළ භාෂාව, ගණිතය සහ බටහිර සංගීතය ඇතුළු ව ප්‍රධාන විෂය හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වීම;

*හා*

අ.පො.ස. (උ. පෙළ) බටහිර සංගීතය විෂයය අමතර විෂයයක් ලෙස සමත් වී තිබීම ;

*හෝ*

4.18.4 2014 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී ඕනෑ ම විෂය තුනකින් (03) සමත් වීම ;

*හා*

බටහිර සංගීතය විෂයයට විශිෂ්ට සාමර්ථ්‍යයක් ද, ඉංග්‍රීසි භාෂාව විෂයයට සම්මාන සාමර්ථ්‍යයක්/ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට සාමාන්‍ය සාමර්ථ්‍යයක් ද සහිත ව සිංහල/ දෙමළ භාෂාව සහ ගණිතය ඇතුළු ව ප්‍රධාන විෂය හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වීම.

***සැලකිය යුතුයි*** :

(i) බටහිර සංගීතය පාඨමාලාව සඳහා පවත්වන ප්‍රායෝගික පරීක්ෂණයේ දී සතුටුදායක කුසලතා මට්ටමකට ළඟා විය යුතු ය.

(ii) අයදුම්කරුවන් තෝරා ගැනීමේ දී ඉහත 4.18.1, 4.18.2, 4.18.3, 4.18.4 අනුපිළිවෙළ අනුව ප්‍රමුඛතාව හිමි වේ.

**4.19 පාඨමාලා අංකය 19 - නාට්‍ය හා රංග කලාව (සිංහල)**
**- නාට්‍ය හා රංග කලාව (දෙමළ)**

4.19.1 2014 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී නාට්‍ය හා රංග කලාව විෂයය ඇතුළු ව විෂය තුනකින් (03) සමත් වීම ;

*හා*

4.19.2 සිංහල/ දෙමළ භාෂාව ද ගණිතය සහ නාට්‍ය හා රංග කලාව/ සංගීතය/ නැටුම්/ චිත්‍ර ඇතුළු ව ප්‍රධාන විෂය හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වීම.

4.19.3 4.19.1 හා 4.19.2 සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අතරින් 3.5 වගන්තියේ සඳහන් ක්‍රමවේදයට අනුව තෝරාගැනීම් සිදු කරනු ලැබේ.

*සැළකිය යුතු යි .:*
බඳවා ගැනීමේ දී අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී නාට්‍ය හා රංග කලාව විෂයය සමත් අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය හිමි වේ. යම් දිස්ත්‍රික්කයක අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී නාට්‍ය හා රංග කලාව විෂයය සමත් අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති වුවහොත් පමණක් අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී නැටුම්/ සංගීතය/ චිත්‍ර විෂයය සමත් අයදුම්කරුවන් තෝරා ගැනීම සඳහා සලකා බලනු ලැබේ.

**4.20 පාඨමාලා අංකය 20 - ශාරීරික අධ්‍යාපනය (සිංහල)**
**ශාරීරික අධ්‍යාපනය (දෙමළ)**
**ශාරීරික අධ්‍යාපනය (ඉංග්‍රීසි)**

4.20.1 2014 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී ඕනෑ ම විෂය තුනකින් (03) සමත් වීම ;

හා

4.20.2 සිංහල/දෙමළ භාෂාව, සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය හා ගණිතය ඇතුළු ව ප්‍රධාන විෂය හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් සමත් වීම ;

හා

4.20.3 පිළිගත් ජවන හා පිටිය මළල ක්‍රීඩා, සංවිධානාත්මක ක්‍රීඩා පිළිබඳ ප්‍රවීණතාවයක්/දක්ෂතාවයක් ලබා තිබීම.

- විවිධ ක්‍රීඩා/ ඉසවු තුනක් සඳහා ඉදිරිපත් කරන සහතික සලකා බලා පහත වගුවේ සඳහන් පරිදි උපරිම ලකුණු 75ක් ප්‍රදානය කරනු ලැබේ ඃ

**ක්‍රීඩා/ඉසව් ප්‍රමුඛතා අනුපිළිවෙළ**

| *අනු. අංකය* | *මට්ටම/ විෂය* | *කේවල* | *සමූහ* | *ස්ථානය/ ශ්‍රේණිය* | *ලකුණු* |
|---|---|---|---|---|---|
| 1 | අන්තර් ජාතික මට්ටම | කේවල | - | 1 | 25 |
| 2 | අන්තර් ජාතික මට්ටම | කේවල | - | 2 | 24 |
| 3 | අන්තර් ජාතික මට්ටම | කේවල | - | 3 | 23 |
| 4 | අන්තර් ජාතික මට්ටම | - | සමූහ | 1 | 22 |
| 5 | අන්තර් ජාතික මට්ටම | - | සමූහ | 2 | 21 |
| 6 | අන්තර් ජාතික මට්ටම | - | සමූහ | 3 | 20 |
| 7 | අන්තර් ජාතික නියෝජනය | කේවල | සමූහ | - | 19 |
| 8 | ජාතික මට්ටම | කේවල | - | 1 | 18 |
| 9 | ජාතික මට්ටම | කේවල | - | 2 | 17 |
| 10 | ජාතික මට්ටම | කේවල | - | 3 | 16 |
| 11 | ජාතික මට්ටම | - | සමූහ | 1 | 15 |
| 12 | ජාතික මට්ටම | - | සමූහ | 2 | 14 |
| 13 | ජාතික මට්ටම | - | සමූහ | 3 | 13 |
| 14 | පළාත් මට්ටම | කේවල | - | 1 | 12 |
| 15 | පළාත් මට්ටම | කේවල | - | 2 | 11 |
| 16 | පළාත් මට්ටම | කේවල | - | 3 | 10 |
| 17 | පළාත් මට්ටම | - | සමූහ | 1 | 09 |
| 18 | පළාත් මට්ටම | - | සමූහ | 2 | 08 |
| 19 | පළාත් මට්ටම | - | සමූහ | 3 | 07 |
| 20 | රෙජිමේන්තු සැරයන් මේජර්/බලලත් නිලධාරී 1 | - | - | - | 06 |

| අනු. අංකය | මට්ටම/ විෂය | කේවල | සමූහ | ස්ථානය/ ශ්‍රේණිය | ලකුණු |
|---|---|---|---|---|---|
| 21 | ජනාධිපති බාලදක්ෂ/බාලදක්ෂිකා | - | - | - | 06 |
| 22 | සාජන්ට් මේජර්/බලලත් නිලධාරී 2 | - | - | - | 05 |
| 23 | දිස්ත්‍රික් මට්ටම/කලාප/ ප්‍රා. ලේ. කාර්යාල | කේවල | - | 1 | 06 |
| 24 | දිස්ත්‍රික් මට්ටම/කලාප/ ප්‍රා. ලේ. කාර්යාල | කේවල | - | 2 | 05 |
| 25 | දිස්ත්‍රික් මට්ටම/කලාප/ ප්‍රා. ලේ. කාර්යාල | කේවල | - | 3 | 04 |
| 26 | දිස්ත්‍රික් මට්ටම/කලාප/ ප්‍රා. ලේ. කාර්යාල | - | සමූහ | 1 | 03 |
| 27 | දිස්ත්‍රික් මට්ටම/කලාප/ ප්‍රා. ලේ. කාර්යාල | - | සමූහ | 2 | 02 |
| 28 | දිස්ත්‍රික් මට්ටම/කලාප/ ප්‍රා. ලේ. කාර්යාල | - | සමූහ | 3 | 01 |

4.20.4 අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය විෂයයට ඔවුන් ලබා ඇති සාමර්ථ්‍යය අනුව පහත දැක්වෙන පරිදි අතිරේක ලකුණු හිමි වේ. :

A සාමර්ථ්‍යය - 05
B සාමර්ථ්‍යය - 03
C සාමර්ථ්‍යය - 02
S සාමර්ථ්‍යය - 01

*සැලකිය යුතු යි :*

(i) ශාරීරික අධ්‍යාපනය පාඨමාලාවට තෝරා ගැනීමේ දී එක් එක් දිස්ත්‍රික්කවල/ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල අයදුම්කරුවන්ගේ ක්‍රීඩා කුසලතා අනුපිළිවෙල අනුව තෝරා ගනු ලැබේ. (4.20.3 වගුව පරිදි)

(ii) පිළිගත් ක්‍රීඩා තරග (අන්තර් ජාතික) - අධ්‍යාපන අමාත්‍යාංශය/ක්‍රීඩා අමාත්‍යාංශය සහ ඒවායේ ලියාපදිංචි ජාතික ක්‍රීඩා සංගම් මගින් (චෙස්, කැරම්, දාම් හැර) ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රීඩා කණ්ඩායම් හෝ පාසල් ජාතික ක්‍රීඩා කණ්ඩායම් නියෝජනය කරමින් සහභාගී වන අන්තර් ජාතික තරග (පාසල් ක්‍රීඩා කණ්ඩායම් පෞද්ගලික ව සහභාගී වන අන්තර් ජාතික තරග සලකා බලනු නොලැබේ).

(iii) පිළිගත් ක්‍රීඩා තරග - අධ්‍යාපන අමාත්‍යාංශය/ක්‍රීඩා අමාත්‍යාංශය/ජාතික තරුණ සේවා සභාව මගින් සංවිධානය කරනු ලබන ජාතික මට්ටමේ ක්‍රීඩා තරග.
පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය/පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය/ජාතික තරුණ සේවා සභාව මගින් සංවිධානය කරනු ලබන පළාත් මට්ටමේ ක්‍රීඩා තරග.
පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය/ ජාතික තරුණ සේවා සභාව මගින් සංවිධානය කරනු ලබන දිස්ත්‍රික් මට්ටමේ ක්‍රීඩා තරග/ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සංවිධානය කරනු ලබන අධ්‍යාපන කලාප මට්ටමේ ක්‍රීඩා තරග.

(iv) ක්‍රීඩා අමාත්‍යාංශය සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලියාපදිංචි හා පිළිගත් ක්‍රීඩා සංගම් මගින් සංවිධානය කරන ලද 'ඒ' ශ්‍රේණියේ තරගවල 1, 2 හා 3 වැනි ස්ථානවලට පමණක් අනුපිළිවෙළින් ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

(v) ඉල්ලුම්පත්‍ර කැඳවීමේ අවසාන දිනයට පූර්වයෙන් වූ වර්ෂ පහ (05) තුළ ලබාගත් ක්‍රීඩා ප්‍රවීණතා/දක්ෂතා මේ සඳහා වලංගු වේ.

(vi) ක්‍රීඩා සහතික තුනකට ලකුණු දීමේ දී ලකුණු හිමි වන්නේ එකම ඉසව්වකට එක ම වසරක දී ලබාගත් සහතිකවලින් එක් ඉහළ ම සහතිකයකට පමණි.

**4.21 පාඨමාලා අංකය 21 - ගෘහ ආර්ථික විද්‍යාව (සිංහල)**
**ගෘහ ආර්ථික විද්‍යාව (දෙමළ)**

4.21.1 2014 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී ගෘහ ආර්ථික විද්‍යාව ඇතුළු ව විෂය තුනකින් (03) සමත් වීම;

හා

4.21.2 සිංහල/දෙමළ භාෂාව, ගණිතය සහ විද්‍යාව/විද්‍යාව හා තාක්ෂණවේදය ඇතුළුව ප්‍රධාන විෂය හයකින් (06) අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත් වීම.

**4.22 පාඨමාලා අංකය 22 - කෘෂි හා ආහාර තාක්ෂණය (සිංහල)**
**කෘෂි හා ආහාර තාක්ෂණය (දෙමළ)**

4.22.1 2014 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී කෘෂි විද්‍යාව, ජීව විද්‍යාව, රසායන විද්‍යාව යන විෂය තුන (03) සමත් වීම ;

හා

ගණිතය සහ විද්‍යාව/විද්‍යාව හා තාක්ෂණවේදය යන විෂයයන්ට සම්මාන සාමර්ථ්‍යයන් සහිත ව සිංහල/දෙමළ භාෂාව ඇතුළු ව ප්‍රධාන විෂය හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වීම.

4.22.2 2014 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී කෘෂිකර්මය/කෘෂි තාක්ෂණවේදය/ජෛව සම්පත් තාක්ෂණවේදය/ආහාර තාක්ෂණවේදය විෂයය ඇතුළු ව විෂය තුනකින් (03) සමත් වීම ;

හා

ගණිතය, විද්‍යාව/විද්‍යාව හා තාක්ෂණවේදය සහ කෘෂිකර්මය/කෘෂි හා ආහාර තාක්ෂණය/උද්‍යාන පාලනය/සත්ත්ව පාලනය/ සමුද්‍ර ජීව සම්පත් තාක්ෂණය/ගොඩතර ජලාශ ජීව සම්පත් තාක්ෂණය/ආහාර විද්‍යාව හා තාක්ෂණය යන විෂය සඳහා සම්මාන සාමර්ථ්‍යය සහිත ව සිංහල/දෙමළ භාෂාව ඇතුළු ව ප්‍රධාන විෂය හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වීම.

**සැළකිය යුතු යි :**

**තෝරා ගැනීමේ ප්‍රමුඛතා අනුපිළිවෙළ :**

(අ) 4.22.1 සුදුසුකම සහ රජයේ පිළිගත් කෘෂිකර්ම විද්‍යාලයක වසරක් හෝ ඊට වඩා වැඩි කෘෂිකර්ම පාඨමාලාවක් හදාරා සාර්ථක ලෙස නිම කර සහතිකයක් ලබා ඇති අයදුම්කරුවන්.

(ආ) 4.22.1 සුදුසුකම හිමි අයදුම්කරුවන්.

(ඉ) 4.22.2 සුදුසුකම හිමි අයදුම්කරුවන්.

**4.23 පාඨමාලා අංකය 23 - තාක්ෂණ අධ්‍යයනය - ශිල්ප කලා (සිංහල)**
**තාක්ෂණ අධ්‍යයනය - ශිල්ප කලා (දෙමළ)**

4.23.1 2014 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී ඕනෑ ම විෂය තුනකින් (03) සමත් වීම ;

හා

4.23.2 ගණිතය සහ සිංහල/ දෙමළ භාෂාව, ශිල්ප කලා/කලා ශිල්ප ඇතුළු ව ප්‍රධාන විෂය හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් සමත් වීම ;

හා

4.23.3 රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක/ජාතික ආධුනිකත්ව මණ්ඩලය/වෘත්තීය පුහුණු අධිකාරිය/ජෙෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව/ කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන දෙපාර්තමේන්තුව/වෙනත් මධ්‍යම රජයේ හෝ පළාත් සභාවක අමාත්‍යාංශයක් යටතේ හෝ පාලනය වන ආයතනයක් මඟින් පවත්වන, විෂය සාධන මට්ටම දක්වෙන විධිමත් සහතික නිකුත් කරනු ලබන මාස දහයකට (10) නොඅඩු විෂය ක්ෂේත්‍රයට අදාළ ශිල්පීය පාඨමාලාවක් හදාරා සාර්ථක ව නිමකර තිබීම.

**සැළකිය යුතු යි :**

(i) **තෝරා ගැනීමේ ප්‍රමුඛතා අනුපිළිවෙළ :**

(අ) 4.23.1, 4.23.2 හා 4.23.3 සහතික හිමි අයදුම්කරුවන්.

(ආ) 4.23.1 හා 4.23.2 සහතික හිමි අයදුම්කරුවන්.

ඉහත (අ) හි සඳහන් සුදුසුකම් සපුරාලූ අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් එක් එක් දිස්ත්‍රික්කවලින් ඉදිරිපත් වී නොමැති නම් 2013 සහ 2012 වසරවල දී (අ) සුදුසුකම් ලද අයදුම්කරුවන් පිළිවෙළින් සලකා බලනු ලැබේ. තවදුරටත් පුරප්පාඩු පැවතිය හොත් පමණක් ඉහත (ආ) හි සුදුසුකම් සපුරාලූ අයදුම්කරුවන් 2014, 2013, 2012 ප්‍රමුඛතා අනුපිළිවෙළින් බඳවා ගැනීම සඳහා සලකා බලනු ලැබේ.

(ii) ඉල්ලුම් පත්‍රයේ අංක 16.1 යටතේ ඉල්ලුම් කරන විෂය ක්ෂේත්‍රය ශිල්ප කලා යන්න පැහැදිලි ව සටහන් කළ යුතු ය.

(iii) ඉල්ලුම් පත්‍ර කැඳවීමේ අවසාන දිනට හෝ ඊට පෙර ඉහත දැක්වෙන සියලු අවශ්‍යතා සම්පූර්ණ කර තිබිය යුතු ය.

| | |
|---|---|
| **4.24 පාඨමාලා අංකය 24 -** | **A නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්‍ෂණවේදය (සිංහල)** |
| **24 -** | **B නිර්මාණකරණය හා යාන්ත්‍රික තාක්‍ෂණවේදය (සිංහල)** |
| **24 -** | **C නිර්මාණකරණය හා විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්‍ෂණවේදය (සිංහල)** |
| **24 -** | **A නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්‍ෂණවේදය (දෙමළ)** |
| **24 -** | **B නිර්මාණකරණය හා යාන්ත්‍රික තාක්‍ෂණවේදය (දෙමළ)** |
| **24 -** | **C නිර්මාණකරණය හා විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්‍ෂණවේදය (දෙමළ)** |

4.24.1 2014 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී ද්‍රෘඪ තාක්‍ෂණවේදයට අයත් සිවිල් තාක්‍ෂණවේදය, යාන්ත්‍රික තාක්‍ෂණවේදය, විදුලිය ඉලෙක්ට්‍රොනික හා තොරතුරු තාක්‍ෂණවේදය යන විෂයන්ගෙන් එකක් ඇතුළු ව විෂය තුනකින් (03) සමත් වීම ;

හෝ

4.24.2 2014 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී ඕනෑ ම විෂය තුනකින් (03) සමත් වීම ;

හා

4.24.3 ගණිතය සහ සිංහල/ දෙමළ භාෂාව ද, ඉදිකිරීම් තාක්‍ෂණය/යාන්ත්‍රික තාක්‍ෂණය/විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්‍ෂණය/ නිර්මාණකරණය හා තාක්‍ෂණවේදය යන විෂයන්ගෙන් එකක් ද ඇතුළු ව ප්‍රධාන විෂය හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් සමත් වීම ;

හා

4.24.4 රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක/ජාතික ආධුනිකත්ව මණ්ඩලය/වෘත්තීය පුහුණු අධිකාරිය/කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන දෙපාර්තමේන්තුව/වෙනත් මධ්‍යම රජයේ හෝ පළාත් සභාවක අමාත්‍යාංශයක් යටතේ හෝ පාලනය වන ආයතනයක් මඟින් පවත්වන, විෂය සාධන මට්ටම දැක්වෙන විධිමත් සහතික නිකුත් කරනු ලබන මාස දහයකට (10) නොඅඩු විෂය ක්ෂේත්‍රයට අදාළ ශිල්පීය පාඨමාලාවක් හදාරා සාර්ථක ව නිමකර තිබීම.

**සැළකිය යුතු යි :**

(i) **තෝරා ගැනීමේ ප්‍රමුඛතා අනුපිළිවෙළ :**

(*අ*) 4.24.1, 4.24.3 හා 4.24.4 සහතික හිමි අයදුම්කරුවන්.

(*ආ*) 4.24.2, 4.24.3 හා 4.24.4 සහතික හිමි අයදුම්කරුවන්.

එසේ වුව ද ඉහත (අ) හා (ආ)හි සඳහන් සුදුසුකම් සපුරාලූ අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් එක් එක් දිස්ත්‍රික්කවලින් ඉදිරිපත් වී නොමැති නම් 2013 සහ 2012 වසරවල දී (අ) හෝ (ආ) සුදුසුකම් ලද අයදුම්කරුවන් පිළිවෙළින් සලකා බලනු ලැබේ.

(ii) ඉල්ලුම් පත්‍රයේ අංක 16.1 යටතේ ඉල්ලුම් කරන විෂය ක්ෂේත්‍රය නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්‍ෂණවේදය/ නිර්මාණකරණය හා යාන්ත්‍රික තාක්‍ෂණවේදය/ නිර්මාණකරණය හා විදුලිය හා ඉලොක්ට්‍රොනික තාක්‍ෂණවේදය යන්න පැහැදිලි ව සටහන් කළ යුතු ය.

(iii) ඉල්ලුම් පත්‍ර කැඳවීමේ අවසාන දිනට හෝ ඊට පෙර ඉහත දැක්වෙන සියලු අවශ්‍යතා සම්පූර්ණ කර තිබිය යුතු ය.

**4.25 පාඨමාලා අංකය 25 - තොරතුරු සන්නිවේදන තාක්‍ෂණය (ඉංග්‍රීසි)**

4.25.1 2014 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ විෂයයට අවම වශයෙන් සම්මාන සාමර්ථ්‍යයක් ඇතුළු ව විෂය තුනකින් (03) (වතු සේවකයන්ගේ දරුවන් පමණක් තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ විෂයය ඇතුළු ව විෂය දෙකකින් (02)) සමත් වීම ;

හා

ඉංග්‍රීසි භාෂාව විෂයයට සම්මාන සාමර්ථ්‍යයක්/ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට සාමාන්‍ය සාමර්ථ්‍යයක් සහ ගණිතයට සම්මාන සාමර්ථ්‍යයක් සහිත ව සිංහල/දෙමළ භාෂාව ඇතුළු ව ප්‍රධාන විෂය හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වීම.

(වතු සේවකයන්ගේ දරුවන් පමණක් ගණිතයට සම්මාන සාමර්ථ්‍යයක් සහිත ව සිංහල/දෙමළ භාෂාව හා ඉංග්‍රීසි භාෂාව ද ඇතුළු ව ප්‍රධාන විෂය හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වීම.)

4.25.2 2014 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය ඇතුළු ව විෂය තුනකින් (03) (වතු සේවකයන්ගේ දරුවන් පමණක් තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ විෂයය ඇතුළු ව විෂය දෙකකින් (02)) සමත් වීම ;

හා

ඉංග්‍රීසි භාෂාව විෂයයට සම්මාන සාමර්ථ්‍යයක්/ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට සාමාන්‍ය සාමර්ථ්‍යයක් හා තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ විෂයයට අවම වශයෙන් සම්මාන සාමර්ථ්‍යයක් ද සහිත ව සිංහල/දෙමළ භාෂාව හා ගණිතය ද ඇතුළු ව ප්‍රධාන විෂය හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් සමත් වීම.

(වතු සේවකයන්ගේ දරුවන් පමණක් ඉංග්‍රීසි භාෂාව, තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය, සිංහල/දෙමළ භාෂාව හා ගණිතය ද ඇතුළු ව ප්‍රධාන විෂය හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් සමත් වීම).

4.25.3 2014 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී භෞතීය විද්‍යා විෂයධාරාවෙන් විෂය තුනකින් (03) (වතු සේවකයන්ගේ දරුවන් පමණක් භෞතීය විද්‍යා විෂයධාරාවෙන් විෂය දෙකකින් (02)) සමත් වීම ;

හා

ඉංග්‍රීසි භාෂාව විෂයයට සම්මාන සාමර්ථ්‍යයක්/ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට සාමාන්‍ය සාමර්ථ්‍යයක් සහ තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය විෂයයට අවම වශයෙන් අධි සම්මාන සාමර්ථ්‍යයක් ද සහිත ව සිංහල/දෙමළ භාෂාව හා ගණිතය ද ඇතුළු ව ප්‍රධාන විෂය හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් සමත් වීම.

(වතු සේවකයන්ගේ දරුවන් පමණක් ඉංග්‍රීසි භාෂාව, තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය, සිංහල/දෙමළ භාෂාව හා ගණිතය ද ඇතුළු ව ප්‍රධාන විෂය හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් සමත් වීම).

4.25.4 2014 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී ජීව විද්‍යා විෂයධාරාවෙන් විෂය තුනකින් (03) (වතු සේවකයන්ගේ දරුවන් පමණක් ජීව විද්‍යා විෂයධාරාවෙන් විෂය දෙකකින් (02)) සමත් වීම ;

හා

ඉංග්‍රීසි භාෂාව විෂයයට සම්මාන සාමර්ථ්‍යයක්/ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට සාමාන්‍ය සාමර්ථ්‍යයක් සහ තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ විෂයයට අවම වශයෙන් අධි සම්මාන සාමර්ථ්‍යයක් ද සහිත ව සිංහල/දෙමළ භාෂාව හා ගණිතය ද ඇතුළු ව ප්‍රධාන විෂය හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් සමත් වීම.

(වතු සේවකයන්ගේ දරුවන් පමණක් ඉංග්‍රීසි භාෂාව, තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය, සිංහල/දෙමළ භාෂාව හා ගණිතය ද ඇතුළු ව ප්‍රධාන විෂය හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් සමත් වීම).

4.25.5 2014 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී කලා විෂයධාරාව හෝ වාණිජ විෂයධාරාව යටතේ විෂය තුනකින් (03) (වතු සේවකයන්ගේ දරුවන් පමණක් කලා විෂය ධාරාව හෝ වාණිජ විෂයධාරාව යටතේ විෂය දෙකකින් (02) සමත් වීම;

හා

ඉංග්‍රීසි භාෂාව විෂයයට සම්මාන සාමර්ථ්‍යයක්/ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට සාමාන්‍ය සාමර්ථ්‍යයක් සහ තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ විෂයයට විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යයක් ද සහිත ව සිංහල/දෙමළ භාෂාව හා ගණිතය ද ඇතුළු ව ප්‍රධාන විෂය හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් සමත් වීම.

(වතු සේවකයන්ගේ දරුවන් පමණක් ඉංග්‍රීසි භාෂාව, තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය, සිංහල/දෙමළ භාෂාව හා ගණිතය ද ඇතුළු ව ප්‍රධාන විෂය හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් සමත් වීම).

- තොරතුරු සන්නිවේදන තාක්ෂණ පාඨමාලාව සඳහා වතු සේවකයින්ගේ දරුවන් තෝරා ගැනීමේ පදනම සෙසු පාඨමාලාවලට එම අයදුම්කරුවන් තෝරා ගැනීමේ පදනම හා සම වේ. නමුත් ඔවුන් සඳහා එම පාඨමාලාව පවත්වනුයේ රුවන්පුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ දී ය.

**සැලකිය යුතු යි :**

**තෝරා ගැනීමේ ප්‍රමුඛතා අනුපිළිවෙළ :**

(එක් එක් දිස්ත්‍රික්ක/ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලින් ලබාගත් Z ලකුණු කුසලතා අගයේ අනුපිළිවෙළට සහ 6.1.2 ඡේදය අනුව වේ.)

(i) 4.25.1 යටතේ සුදුසුකම් සපුරන අයදුම්කරුවන්
(ii) 4.25.2 යටතේ සුදුසුකම් සපුරන අයදුම්කරුවන්.
(iii) 4.25.3 යටතේ සුදුසුකම් සපුරන අයදුම්කරුවන්
(iv) 4.25.4 යටතේ සුදුසුකම් සපුරන අයදුම්කරුවන්.
(v) 4.25.5 යටතේ සුදුසුකම් සපුරන අයදුම්කරුවන්.

**4.30 පාඨමාලා අංකය 30 - දෙවන බස (සිංහල)**

4.30.1 2014 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී සිංහල භාෂාවට සම්මාන සාමර්ථ්‍යයක් සහිත ව විෂය තුනකින් (03) සමත් වීම ;

හා

4.30.2 අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී සිංහල භාෂාව, ගණිතය ඇතුළු ව ප්‍රධාන විෂය හයකින් (06) සමත් වීම.

**සැලකිය යුතු යි :**
මෙම පාඨමාලාවට බඳවා ගැනීමේ දී අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී දෙවන බස (දෙමළ) විෂයය හෝ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ දෙවන භාෂාව (දෙමළ) උසස් පාඨමාලාව හෝ වෛකල්පිත දෙමළ භාෂාව සමත් සිසුන්ට අනුපිළිවෙළින් ප්‍රමුඛතාවය හිමි වේ.

**4.31 පාඨමාලා අංකය 31 - දෙවන බස (දෙමළ)**

4.31.1 2014 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී දෙමළ භාෂාවට සම්මාන සාමර්ථ්‍යයක් ඇතුළු ව විෂය තුනකින් (03) සමත් වීම ;

හා

4.31.2 අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී දෙමළ භාෂාව, ගණිතය ඇතුළු ව ප්‍රධාන විෂය හයකින් (06) සමත්වීම.

***සැලකිය යුතු යි :***

මෙම පාඨමාලාවට බඳවා ගැනීමේ දී අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී දෙවන බස (සිංහල) විෂයය හෝ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ දෙවන භාෂාව (සිංහල) උසස් පාඨමාලාව හෝ වෛකල්පිත සිංහල භාෂාව සමත් සිසුන්ට අනුපිළිවෙළින් ප්‍රමුඛතාවය හිමි වේ.

**4.32 පාඨමාලා අංකය 32 - විශේෂ අධ්‍යාපනය (සිංහල)**
**විශේෂ අධ්‍යාපනය (දෙමළ)**

4.32.1 2014 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී ඕනෑ ම විෂය තුනකින් (03) සමත් වීම ;

හා

4.32.2 සිංහල/දෙමළ භාෂාව, ගණිතය ඇතුළු ව ප්‍රධාන විෂය හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වීම.

***සැලකිය යුතු යි :***
මෙම පාඨමාලාවට තෝරාගනු ලබන අයදුම්කරුවන්ට පාඨමාලාවෙන් පසුව විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත ශ්‍රවණ, දෘෂ්ටි, බුද්ධිමය ඌනතා, ඔටිසම්, ඉගෙනුම් දුෂ්කරතා, බහුවිධ දුබලතා සහිත සිසුන් සඳහා වන ගුරුවරුන් ලෙස පත්වීම් ලබා දීම

සඳහා සලකා බලනු ඇත. එබැවින් ඉහත විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන් සිටින ඒකකවල අනිවාර්යයෙන් සේවය කිරීමට එකඟ වන බවට ගිවිසුමකට එළඹීමට කැමති අයදුම්කරුවන් පමණක් මෙම පාඨමාලාවට අයදුම් කළ යුතු වේ.

එමෙන් ම මෙම පාඨමාලාවේ සේවාලාභීන් විශේෂ අවශ්‍යතා ඇති සිසුන් වේ. එවැනි සිසුන්ට සහය වීමට ප්‍රමාණවත් මානසික හා ශාරීරික යෝග්‍යතාවක් නොමැති අපේක්ෂකයන් මෙම පාඨමාලාවට ඉල්ලුම් කිරීමෙන් වැළකීම සුදුසු වේ.

**විශේෂ අවධානය පිණිසයි —**

පහත සඳහන් කරුණු 2017 වර්ෂයේ හෝ ඊට පසු වර්ෂවල බඳවා ගැනීම්වලට අදාළ ව ඔබගේ පූර්ව දැනගැනීම සඳහා ඉදිරිපත් කරනු ලැබේ.

* **2015 අ. පො. ස. (උ. පෙළ) විෂයමාලා සංශෝධනවලට ද අනුගාමීව 2017 වර්ෂය සඳහා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ බඳවා ගැනීමේ දී ඉහත සඳහන් පාඨමාලාවලට අදළ ව බඳවා ගැනීමේ සුදුසුකම්වල සාධනීය සංශෝධන සිදු කිරීමට නියමිත ය.**

* **2015** අ. පො. ස. (උ. පෙළ) විභාගයේ ප්‍රතිඵල මත 2017 වර්ෂයට ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල බුද්ධ ධර්මය පාඨමාලාවට තෝරාගැනීමේ දී බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලයේ එක් අවුරුදු ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම සලකා බැලීමට යෝජිත ය,

* **2017** වසර සඳහා **2015** අ. පො. ස. (උ.පෙළ) ප්‍රතිඵල මත ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල කතෝලික ධර්මය/ක්‍රිස්තියානි ධර්මය පාඨමාලාවට තෝරා ගැනීමේ දී 4.8.2 යටතේ දක්වෙන සුදුසුකම්වලට අමතර ව ඇක්වයිනාස් උසස් අධ්‍යාපන ආයතනයේ තුන් අවුරුදු ආගමික අධ්‍යයන පාඨමාලා සහතිකය සහ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වන කතෝලික දහම් පාසල් අවසාන විභාග සහතිකය ද සලකා බැලීමට අපේක්ෂිත ය.

* **2018** වසර සඳහා **2016** අ. පො. ස. (උ.පෙළ) ප්‍රතිඵල මත ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට තොරතුරු සන්නිවේදන තාක්ෂණය පාඨමාලාවට තෝරාගැනීමේ දී 12 ශ්‍රේණියේ සාමාන්‍ය තොරතුරු තාක්‍ෂණය ( GIT) විභාගය සමත්වීම හා තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය සඳහා (NVQ -ජාතික වෘත්තීය සුදුසුකම) 03 මට්ටමට අදළ සහතිකය ද ලබා තිබීම සලකා බැලීමට යෝජිත ය.

**5.0 පාඨමාලා අංකය, පාඨමාලාවේ නම, මාධ්‍යය අනුව එක් එක් පාඨමාලාව පැවැත්වෙන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය එහි අංකය සහිත ව පහතින් දක්වේ. :-**

කරුණාකර මේ වගුව හොඳින් පරීක්ෂා කරන්න. සම්මුඛ පරීක්ෂණ සඳහා එක් එක් පාඨමාලාවට අදාළ පරිගණක ලේඛන සකස් කිරීමේ දී ඔබේ ඉල්ලුම්පත්‍රය පරිගණක ගත කරන්නේ පාඨමාලා අංකය අනුව ය. නිවැරදි තොරතුරු සටහන් නොකළ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම් පත්‍රය අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන විද්‍යාපීඨ ශාඛාවට ඉදිරිපත් කළ පසු කිසිදු සංශෝධනයක් කිරීමට ඉඩ දෙනු නොලැබේ. කෙසේ වෙතත් ඕනෑ ම පාඨමාලාවක් විද්‍යාපීඨ තුළ යෝග්‍ය පරිදි ස්ථානගත කිරීම පිළිබඳ අවසන් තීරණ අධ්‍යාපන විද්‍යායතන මණ්ඩලය/අධ්‍යාපන ලේකම් සතු වේ. ඃ

i. තීරුව - පාඨමාලා අංකය

ii. තීරුව - පාඨමාලාවේ නම

iii. තීරුව - සිංහල මාධ්‍යයෙන් පාඨමාලා පැවැත්වෙන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ

iv. තීරුව - දෙමළ මාධ්‍යයෙන් පාඨමාලා පැවැත්වෙන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ

v. තීරුව - ඉංග්‍රීසි මාධ්‍යයෙන් පාඨමාලා පැවැත්වෙන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ
(ඒ ඒ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ අංකය පීඨයේ නම ඉදිරියෙන් වරහන් තුළ දක්වේ.)

| පාඨමාලා අංකය | පාඨමාලාවේ නම | මාධ්‍යය අනුව එක් එක් පාඨමාලාව පැවැත්වෙන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සහ ඒවායේ අංකය | | |
|---|---|---|---|---|
| | | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය |
| i | ii | iii | iv | v |
| 01 | ප්‍රාථමික අධ්‍යාපනය | (1) ඌව | (6) වවුනියා | |
| | | (2) නිල්වලා | (7) ශ්‍රීපාද | |
| | | (3) මහවැලි | (8) අඩ්ඩාලච්චේන | |
| | | (4) සාරිපුත්ත (දඹදෙණිය) | (9) මඩකලපුව | |
| | | (7) ශ්‍රීපාද | (15) යාපනය | |
| | | (10) පස්දුන්රට | (16) දර්ගා නගර් | |
| | | (11) පුලතිසිපුර | | |
| | | (12) වයඹ | | |
| | | (13) රුවන්පුර | | |
| | | (14) රුහුණ | | |
| | | (17) හාපිටිගම් | | |
| | | (19) මහරගම | | |
| 02 | විද්‍යාව | (2) නිල්වලා | (6) වවුනියා | (2) නිල්වලා |
| | | (5) සියනෑ | (7) ශ්‍රීපාද | (5) සියනෑ |
| | | (7) ශ්‍රීපාද | (8) අඩ්ඩාලච්චේන | (15) යාපනය |
| | | | (9) මඩකලපුව | |
| | | | (15) යාපනය | |
| 03 | ගණිතය | (2) නිල්වලා | (6) වවුනියා | (2) නිල්වලා |
| | | (5) සියනෑ | (7) ශ්‍රීපාද | (5) සියනෑ |
| | | (7) ශ්‍රීපාද | (8) අඩ්ඩාලච්චේන | (15) යාපනය |
| | | (10) පස්දුන්රට | (15) යාපනය | |
| 04 | සමාජීය විද්‍යාව | | (7) ශ්‍රීපාද | |
| 05 | බුද්ධ ධර්මය | (4) සාරිපුත්ත/දඹදෙණිය | | |
| 06 | හින්දු ධර්මය | | (6) වවුනියා | |
| 07 | ඉස්ලාම් ධර්මය | | (8) අඩ්ඩාලච්චේන | |
| 08 | කතෝලික ධර්මය/ ක්‍රිස්තියානි ධර්මය | (12) වයඹ | (6) වවුනියා | |
| 09 | පළමුබස (සිංහල) | (12) වයඹ | | |
| | | (18) පේරාදෙණිය | | |
| 10 | පළමුබස (දෙමළ) | | (7) ශ්‍රීපාද | |
| | | | (16) දර්ගා නගර් | |
| | | | (18) පේරාදෙණිය | |
| 11 | ඉංග්‍රීසි | | | (3) මහවැලි |
| | | | | (10) පස්දුන්රට |
| | | | | (15) යාපනය |
| | | | | (18) පේරාදෙණිය |
| 13 | චිත්‍ර | (3) මහවැලි | (7) ශ්‍රීපාද | |
| | | (12) වයඹ | (9) මඩකලපුව | |
| | | | (15) යාපනය | |
| 14 | නැටුම් (පෙරදිග) | (3) මහවැලි | | |
| | | (12) වයඹ | | |
| 15 | නැටුම් (භරත) | | (7) ශ්‍රීපාද | |
| | | | (15) යාපනය | |

| පාඨමාලා අංකය | පාඨමාලාවේ නම | මාධ්‍යය අනුව එක් එක් පාඨමාලාව පැවැත්වෙන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සහ ඒවායේ අංකය | | |
|---|---|---|---|---|
| | | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය |
| *i* | *ii* | *iii* | *iv* | *v* |
| 16 | සංගීතය (පෙරදිග) | (3) මහවැලි | | |
| | | (12) වයඹ | | |
| 17 | සංගීතය (කර්ණාටක) | | (7) ශ්‍රීපාද | |
| | | | (15) යාපනය | |
| 18 | බටහිර සංගීතය | | | (3) මහවැලි |
| 19 | නාට්‍ය හා රංග කලාව | (3) මහවැලි | (9) මඩකලපුව | |
| | | (12) වයඹ | | |
| 20 | ශාරීරික අධ්‍යාපනය | (1) ඌව | (6) වවුනියා | (1) ඌව |
| | | (2) නිල්වලා | (9) මඩකලපුව | |
| | | (14) රුහුණ | | |
| 21 | ගෘහ ආර්ථික විද්‍යාව | (14) රුහුණ | (6) වවුනියා | |
| | | | (16) දර්ගා නගර් | |
| 22 | කෘෂි හා ආහාර තාක්‍ෂණය | (11) පුලතිසිපුර | (6) වවුනියා | |
| 23 | තාක්‍ෂණ අධ්‍යයනය - ශිල්ප කලා | (5) සියනෑ | (9) මඩකලපුව | |
| 24 | නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්‍ෂණවේදය/නිර්මාණකරණය හා යාන්ත්‍රික තාක්‍ෂණවේදය/ නිර්මාණකරණය හා විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්‍ෂණවේදය | (5) සියනෑ | (9) මඩකලපුව | |
| 25 | තොරතුරු සන්නිවේදන තාක්‍ෂණය | | | (13) රුවන්පුර |
| | | | | (19) මහරගම |
| 30 | දෙවන බස (සිංහල) | (3) මහවැලි | | |
| 31 | දෙවන බස (දෙමළ) | | (3) මහවැලි | |
| 32 | විශේෂ අධ්‍යාපනය | (17) හාපිටිගම් | (8) අඩ්ඩාලච්චේන | |
| | | (19) මහරගම | (15) යාපනය | |

***සැලකිය යුතු යි :***

- දෙමළ මාධ්‍යයෙන් පාඨමාලා පැවැත්වෙන දර්ගා නගර් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට අයදුම්කළ යුත්තේ කාන්තාවන් පමණි.

**6.0 2016 වර්ෂය සඳහා ශික්‍ෂණලාභීන් තෝරා ගැනීමේ පටිපාටිය**

**6.1 තෝරා ගැනීමේ පදනම :**

6.1.1 2019 වර්ෂයේ දී ගුරුභවතුන් විශ්‍රාම යාම නිසා, පාසල් පද්ධතියේ ඇතිවන ගුරු පුරප්පාඩු සංඛ්‍යාව සහ මේ වන විට ද පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව හා දුෂ්කර ප්‍රදේශවල විෂය විවිධත්වය ඇති කිරීමේ අවශ්‍යතාව පිළිබඳව ද සලකා බලා විෂය මට්ටමින් ගුරු අවශ්‍යතාව ගණනය කර එම සංඛ්‍යාව 2016 වර්ෂයේ දී එක් එක් පාඨමාලාවට පවතින ඉඩපහසුකම් ප්‍රමාණය සමග ගලපා, බඳවා ගනු ලබන ශික්ෂණලාභීන් සංඛ්‍යාව තීරණය කර ඇත.

නුවරඑළිය, හම්බන්තොට, යාපනය, කිලිනොච්චිය, මන්නාරම, වවුනියාව, මුලතිව්, මඩකලපුව, අම්පාර, ත්‍රිකුණාමලය, පුත්තලම, අනුරාධපුරය, පොළොන්නරුව, බදුල්ල, මොණරාගල හා රත්නපුර යන දුෂ්කර දිස්ත්‍රික්කයන්හි ප්‍රාථමික අධ්‍යාපනය, විද්‍යාව, ගණිතය හා ඉංග්‍රීසි භාෂාව යන පාඨමාලා සඳහා ඒ ඒ පාඨමාලාවලට බඳවා ගනු ලබන මුළු සංඛ්‍යාවෙන් වැඩි ප්‍රතිශතයක් වෙන් කරනු ලැබේ.

පාසල් පද්ධතිය තුළ විෂය මට්ටමින් විශාල පුරප්පාඩු සංඛ්‍යාවක් පැවතිය හැකි වුව ද, බඳවා ගනු ලබන සංඛ්‍යාව සඳහා බලපානු ලබන ප්‍රධානතම සාධකය වන්නේ විද්‍යාපීඨවල එක් එක් පාඨමාලාව සඳහා පහසුකම් සපයාදිය හැකි සංඛ්‍යාවයි.

6.1.1.1 ඒ අනුව 2016 වර්ෂයේ බඳවා ගැනීම පහත සඳහන් පරිදි පදනම් 02ක් යටතේ සිදු කෙරේ.

(i) යම් පාඨමාලාවකට අදළ ව බඳවා ගන්නා අයදුම්කරුවන් සංඛ්‍යාව පනහක් (50) හෝ ඊට අඩු වේ නම්, එහි දී දිවයිනේ දිස්ත්‍රික්ක විසිපහම හෝ අදළ මාධ්‍යයෙන් විෂයය ක්‍රියාත්මක වන දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි දිස්ත්‍රික්ක පදනමින් ඉහළ ම සුදුසුකම්ලත් අයදුම්කරුවන් Z අගය පදනම් කරගෙන තෝරාගනු ලැබේ.

(ii) යම් පාඨමාලාවකට අදළ ව බඳවා ගන්නා අයදුම්කරුවන් සංඛ්‍යාව පනහට (50) වඩා වැඩිනම්, එයින් 50%ක ප්‍රතිශතයක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පදනමින් ද, ඉතිරි 50%ක ප්‍රතිශතය දිස්ත්‍රික්ක පදනමින් ද අයදුම්කරුවන් තෝරා ගනු ලැබේ.

(ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට බඳවා ගන්නා අයදුම්කරුවන් සංඛ්‍යාව පනහ (50) හෝ ඊට අඩුවන පාඨමාලා සඳහා වැවිලි දිස්ත්‍රික්කවල පදිංචි ඉහළ ම සුදුසුකම් සහිත අයදුම්කරුවන් Z අගය පදනම් කරගනිමින් තෝරාගනු ලැබේ. එම විද්‍යාපීඨයට බඳවා ගන්නා සංඛ්‍යාව පනහට (50) වැඩිවන පාඨමාලා සඳහා 50%ක ප්‍රතිශතයක් වැවිලි දිස්ත්‍රික්කයන්ට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පදනමින් ද, ඉතිරි 50% අදළ වැවිලි දිස්ත්‍රික්ක පදනමින් ද තෝරා ගනු ලැබේ.)

6.1.2 කතෝලික/ක්‍රිස්තියානි ධර්මය (සිංහල මාධ්‍යය) පාඨමාලාව සහ ශාරීරික අධ්‍යාපනය පාඨමාලාව හැර අනෙකුත් පාඨමාලා සඳහා බඳවා ගැනීමේ මූලික පදනම වන්නේ 6.1.1.1 හි සඳහන් බඳවා ගැනීමේ පදනමට අදළ ව Z ලකුණු කුසලතා අනුපිළිවෙළයි.

Z ලකුණු කුසලතාව අනුව තෝරා ගන්නා පාඨමාලාවල දී අදළ දිස්ත්‍රික්කයේ/ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ එක ම Z අගයක් ලබා ගෙන ඇති සිසුන් කිහිපදෙනෙකු අතරින් එක් අයෙකු තෝරා ගැනීමට සිදු වන විටක දී / 4.11.2 හෝ 4.11.3හි සඳහන් ක්‍රමවේදය තුළ අයදුම්කරුවන් දෙදෙනෙකුගේ හෝ ඊට වැඩි ප්‍රමාණයකගේ ලකුණු සමානවන විට දී/ක්‍රීඩා කුසලතා සඳහා එකම ලකුණක සිසුන් කිහිපදෙනෙකු අතරින් එක් අයෙකු තෝරා ගැනීමට සිදු වන විටක දී, පළමුවරට අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී ලබා ගත් ප්‍රතිඵල සැලකිල්ලට භාජනය කෙරේ. ඒ අනුව විශිෂ්ට සාමර්ථ්‍යයට ලකුණු 04ක් ද, අධි සම්මාන සාමර්ථ්‍යයට ලකුණු 03ක් ද, සම්මාන සාමර්ථ්‍යයට ලකුණු 02ක් ද, සාමාන්‍ය සාමර්ථ්‍යයට ලකුණු 01ක් ද බැගින් ලකුණු ප්‍රදනය කොට සමස්ත ලකුණු සංඛ්‍යාව පදනම් කර ගනිමින් තෝරා ගැනීම සිදු කරනු ලැබේ. මෙම ලකුණු දීම ප්‍රධාන විෂය අටකට (08) පමණක් (3.2හි සඳහන් කර ඇති) සීමා කෙරේ. 4.11.2 හෝ 4.11.3හි සඳහන් පරිදි/ක්‍රීඩා කුසලතා සඳහා හා අ. පො. ස. (සා. පෙළ)ට ලබා දෙන ලකුණ ද සමාන වන අවස්ථාවක 6.1.1.1හි සඳහන් නියමිත බඳවා ගැනීමේ පදනමට අදළ ව Z අගය ප්‍රමුඛතා අනුපිළිවෙළට තෝරා ගනු ලැබේ.

6.1.3 ශාරීරික අධ්‍යාපනය, නැටුම් (පෙරදිග), නැටුම් (භරත), සංගීතය (පෙරදිග), සංගීතය (කර්ණාටක) සහ බටහිර සංගීතය පාඨමාලාව සඳහා පවත්වන ප්‍රායෝගික පරීක්ෂණයේ දී 6.1.1.1හි සඳහන් පාඨමාලාවට බඳවා ගනු ලබන පදනමට අදාළ ව විෂය ප්‍රවීණතාවය සනාථ කළ යුතු ය.

6.1.4

6.1.4.1 එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොසිටින අවස්ථාවක දී දිස්ත්‍රික්ක කුසලතා ද, එසේ නොමැතිනම් පළාත් කුසලතා ද අනුපිළිවෙළින් සලකා තෝරා ගැනීම් සිදු කෙරේ.

6.1.4.2 දිස්ත්‍රික් පදනමින් තෝරා ගැනීමේ දී අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොසිටින අවස්ථාවක දී පළාත් කුසලතාවය සලකා තෝරා ගැනීම් සිදු කෙරේ.

**6.2 ස්ථිර පදිංචිය නිර්ණය -**

6.2.1 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පදනමින් බඳවා ගැනීමේ දී, අයදුම්කරු අයදුම් කරනු ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වන්නේ ඔහු/ ඇය පළමු වරට අ.පො.ස. (උ. පෙළ) විභාගයට පෙනී සිටි වර්ෂය සහ ඊට පූර්වාසන්න වසර දෙකෙහි ස්ථිර ව පදිංචි ව සිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය යි.

6.2.2 දිස්ත්‍රික්ක පදනමින් බඳවා ගැනීමේ දී අයදුම්කරු අයදුම් කරනු ලබන දිස්ත්‍රික්කය වන්නේ ඔහු/ඇය පළමුවරට අ.පො.ස. (උ. පෙළ) විභාගයට පෙනී සිටි වර්ෂය හා ඊට පූර්වාසන්න වසර දෙකෙහි ස්ථිර ව පදිංචි ව සිටි දිස්ත්‍රික්කය යි.

- පළාත් කුසලතාවය සලකා බැලීමේ දී අයදුම්කරු පළමුවරට අ.පො.ස. (උ. පෙළ) විභාගයට පෙනී සිටි වර්ෂය හා ඊට පූර්වාසන්න වසර දෙකෙහි ඔහු/ ඇය ස්ථිර ව පදිංචි ව සිටි පළාත අයදුම් කරනු ලබන පළාත සේ සලකනු ලැබේ.

- බඳවා ගැනීමේ පදනමට අදාළ ව, අයදුම්කරුවන් විසින් තම ස්ථිර පදිංචිය ඡන්ද හිමි නාමලේඛනවල සහතික කරන ලද උපුටන මගින් සනාථ කළ යුතු වේ.

- යම් හෙයකින් නියමිත වසර තුනට (03) හෝ ඉන් කිහිපයකට අදාළ ව, ඡන්ද හිමි නාමලේඛනවල සහතික කරන ලද උපුටන මගින් පදිංචිය සනාථ කිරීමට නොහැකි අවස්ථාවල දී ඡන්දය ලියාපදිංචි කිරීමට නොහැකි වීමට අදාළ පිළිගත හැකි හේතු ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන පදිංචිය හා චරිතය පිළිබඳ සහතිකයේ (DS 04) ‘වෙනත් කරුණු තීරය’ යටතේ ස්ථිර පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි අත්සනින් සහ ප්‍රාදේශීය ලේකම් අනු අත්සනින් සනාථ කළ යුතු වේ.

- අයදුම්කරුගේ වයස සම්පූර්ණ නොවීම නිසා ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචි වීමට නොහැකි වූ අදාළ වර්ෂයන් සඳහා දෙමාපියන්ගේ නම් ඇතුළත් ඡන්ද හිමි නාමලේඛනවල උපුටන මඟින් ස්ථිර පදිංචිය සනාථ කළ යුතු වේ.
- යම් හෙයකින් දෙමාපියන් හැර වෙනත් භාරකරුවකු යටතේ අදාළ කාලසීමාවේ ස්ථිර ව පදිංචි වී සිටි අයදුම්කරුවන් එම භාරකාරත්වය අදාළ කාලසීමාව ද සමඟින් ග්‍රාම සේවක විසින් නිකුත් කරනු ලබන පදිංචිය හා චරිතය පිළිබඳ සහතිකයේ (DS - 04) 'වෙනත් කරුණු' තීරය යටතේ සඳහන් කර සනාථ කළ යුතු වේ. අයදුම්කරුගේ ඡන්දය නොමැති වර්ෂ සඳහා භාරකරුගේ ඡන්ද හිමි නාමලේඛනවල සහතික කළ උපුටන මඟින් පදිංචිය සනාථ කළ යුතු වේ.
- වසර එකකට හෝ දෙකකට අදාළ ව පමණක් ඡන්දය හිමි නාමලේඛන උපුටන ඉදිරිපත් කරන අවස්ථාවල දී, ඉතිරි වසර සඳහා පිළිගත හැකි වෙනත් ලේඛනවලින් පදිංචිය සනාථ කළ යුතු වේ. (*උදා:-* ග්‍රාම නිලධාරී සහතිකය, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ හැඳුනුම්පතෙහි ලිපිනය).

6.2.3. ඉහත 6.2.1/ 6.2.2 යටතේ හෝ පළාතේ හෝ පදිංචිය සනාථ කළ නොහැකි අයදුම්කරුවන් සඳහා ඔහු/ඇය පළමුවරට අ.පො.ස. (උ. පෙළ) විභාගයට පෙනී සිටි පාසල/විභාග මධ්‍යස්ථානය අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය/දිස්ත්‍රික්කය/ පළාත තමන් අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය/දිස්ත්‍රික්කය/ පළාත ලෙස සලකනු ලැබේ.

**6.3 ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට තෝරා ගැනීම -**

6.3.1 බඳවා ගන්නා සංඛ්‍යාවෙන් 75%ක් ඉන්දියානු ද්‍රවිඩ සම්භවය ඇති අයදුම්කරුවන්ගෙන් ද, 25%ක් සිංහල අයදුම්කරුවන්ගෙන් ද පුරවනු ලැබේ.

6.3.1.1 වැවිලි දිස්ත්‍රික්කවල/එම දිස්ත්‍රික්කයන්ට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පවත්නා පුරප්පාඩුවල ප්‍රමාණාත්මක භාවය අනුව අයදුම්කරුවන්ගෙන් 35%ක් මොණරාගල, බදුල්ල සහ රත්නපුර යන දිස්ත්‍රික්කවලට/එම දිස්ත්‍රික්කවලට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට වෙන් කෙරේ.

6.3.2

6.3.2.1 ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට ඉල්ලුම් කළ යුත්තේ නුවරඑළිය, මහනුවර, මාතලේ, බදුල්ල, මොණරාගල, රත්නපුර, කෑගල්ල, කළුතර, මාතර, ගාල්ල සහ කුරුණෑගල යන වැවිලි දිස්ත්‍රික්කවල/ අදාළ දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පදිංචි වැවිලි අංශයේ සේවයේ නියුතු අයගේ දරුවන් පමණි. මේ වන විට වැවිලි අංශයේ සේවයේ නියුතු අයගේ දරුවන්ට හා මේ වන විටත් වතුවල පදිංචි, වැවිලි අංශයේ වසර 25ක් සේවය කිරීමෙන් පසුව 2005 - 2014 වසර අතරතුර කාලයෙහි විශ්‍රාම ගිය, අසනීප හේතුවෙන් සේවයෙන් ඉවත් වූ හෝ මරණයට පත් වූ අයගේ දරුවන්ට ප්‍රමුඛතාව හිමි වේ.

6.3.2.2 6.3.2.1හි සඳහන් අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති වුවහොත් දැනට වතු අංශයේ සේවය නොකළ ද 2005 හෝ ඊට පසු වර්ෂවල වතු අංශයේ අවම වශයෙන් වසර 05ක්, 04ක්, 03ක් අඛණ්ඩව සේවය කළ අයගේ දරුවන් පිළිබඳ ව පිළිවෙළින් සලකා බලනු ලැබේ. (ප්‍රමුඛතාව හිමි වන්නේ 2014, 2013, 2012 ආදී වශයෙන් අනුපිළිවෙළිනි).

6.3.2.3 යම් දෙමළ මාධ්‍ය පාඨමාලාවකට ඉහත අයදුම්කරුවන් අතුරින් ද සුදුසුකම් ලබන ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති නම් ඉහත දිස්ත්‍රික්කවල/දිස්ත්‍රික්කවලට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨසවල පදිංචි වැවිලි අංශයේ සේවය නොකරන එහෙත් ඉන්දියානු සම්භවයක් සහිත අයදුම්කරුවන් පිළිබඳ ව සලකා බලනු ලැබේ.

6.3.2.4 ඒ අනුව ද ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති නම් වෙනත් දිස්ත්‍රික්කවල/වෙනත් දිස්ත්‍රික්කවලට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පදිංචි ඉන්දියානු සම්භවයක් ඇති දෙමළ මාධ්‍ය අයදුම්කරුවන් පිළිබඳ ව සලකා බලනු ලැබේ.

6.3.2.5 වැවිලි අංශයේ සේවය නොකරන එහෙත් වැවිලි දිස්ත්‍රික්කවල/එම දිස්ත්‍රික්කවලට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පදිංචි ඉන්දියානු සම්භවයක් ඇති දෙමළ මාධ්‍ය අයදුම්කරුවන් සහ වෙනත් දිස්ත්‍රික්කවල/වෙනත් දිස්ත්‍රික්කවලට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පදිංචි ඉන්දියානු සම්භවයක් ඇති දෙමළ මාධ්‍ය අයදුම්කරුවන් සඳහා අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී නියමිත විෂය තුනක් (03) සමත් වීම අනිවාර්ය වේ.

6.3.2.6 සිංහල මාධ්‍ය පාඨමාලාවලට වැවිලි දිස්ත්‍රික්කවල/එම දිස්ත්‍රික්කවලට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පදිංචි වැවිලි අංශයේ සේවකයන්ගේ දරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති වුවහොත් ඉතිරි පුරප්පාඩු පුරවනු ලබන්නේ ශ්‍රීපාද/වෙනත් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල එම පාඨමාලාවලට අයදුම්කර ඇති අයදුම්කරුවන් අතරින් ඔවුන්ගේ Z අගය පදනම් කර ගනිමිනි.

6.3.3 සම්මුඛ පරීක්ෂණයේ දී රාජ්‍ය හා ලියාපදිංචි පෞද්ගලික වතු සමාගම්වල සේවකයන්ගේ දරුවන් ඒ බව තහවුරු කිරීම සඳහා පහත සඳහන් ලිපිලේඛන අතරින් තමාට අදාළ ලේඛන ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය වේ.

- දැනට වතු අංශයේ සේවයේ නියුතුවන්නන් වැවිලි අංශයේ සේවයේ නියුතු ව සිටින බව (අදාළ කාලවකවානුව සහිත ව) හා වතුවල ස්ථිර පදිංචි ව සිටින බවට වතු අධිකාරි විසින් සහතික කළ ලිපිය.

- වසර විසිපහක (25) සේවා කාලයකින් පසුව 2005 - 2014 කාලය අතරතුර, අසනීප තත්ත්වයක් හේතුවෙන් වතු සේවයෙන් ඉවත් වී/විශ්‍රාම ගොස් ඇති සේවකයන් හෝ මරණයට පත් වී ඇති සේවකයන්ගේ පවුල්වල සාමාජිකයන් මේ වන විටත් වතුවල ස්ථිර ව පදිංචි ව සිටින බවට අදාළ පදිංචිය සහ සේවයෙන් ඉවත් වූ/ විශ්‍රාම ගිය වර්ෂය හා දිනය පැහැදිලි ව සනාථ කරමින් වතු අධිකාරී විසින් නිකුත් කළ ලිපිය.

- වතු සේවයේ යෙදී සිට 2005 හෝ ඊට පසු වර්ෂයක දී විශ්‍රාම ගොස් ඇති/ වතු සේවයෙන් ඉවත් වී ඇති සේවකයන් තමන් පසුගිය වසර පහක් (05) හෝ ඊට වැඩි කාලයක් අඛණ්ඩ ව සේවයේ නියුතු ව සිටි බව සනාථ කරමින් විශ්‍රාම ගිය/ වතු සේවයෙන් ඉවත් වූ වර්ෂය හා දිනය පැහැදිලි ව සඳහන් වතු අධිකාරී විසින් නිකුත් කළ ලිපිය.

- සේවක අර්ථසාධක අරමුදලට අයකිරීම් සිදු කරන බව ලියාපදිංචි අංක සහිත ව සනාථ කරන ලිපි.

6.3.4 අයදුම්කරුවන් පාඨමාලාවෙන් පසුව වතු අංශයේ පාසල්වල අඛණ්ඩ ව වසර දහයක් (10) සේවය කරන බවට පොරොන්දු වන දිවුරුම් ප්‍රකාශයක් සම්මුඛ පරීක්ෂණයේ දී අනිවාර්යයෙන් ඉදිරිපත් කළ යුතු වේ.

**සැළකිය යුතු යි:**

සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ ඉන්දියානු සම්භවයක් ඇති අයදුම්කරුවෙකු නම් ඉන්දියානු සම්භවයට හිමි ප්‍රතිශතය සඳහා සලකා බලනු ලැබේ. එමෙන් ම දෙමළ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහල අයදුම්කරුවකු නම් සිංහල මාධ්‍ය ප්‍රතිශතය සඳහා සලකා බලනු ලැබේ.

7.0 **තෝරා ගැනීමට අදාළ වෙනත් කරුණු :**

7.1 තෝරාගනු ලබන අයදුම්කරුවන් අදාළ පාඨමාලාව සඳහා යෝග්‍යතාවය සනාථ කිරීමට පිළිගත හැකි සාක්ෂි සහ සහතිකවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනට ඉදිරිපත් කිරීමට සූදානම් ව සිටිය යුතු ය. ඒ ඒ දිස්ත්‍රික්කයෙන්/ ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් බඳවා ගැනීමට නියමිත සංඛ්‍යාවෙන් තුන් ගුණයක සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. නියමිත දින කිසිදු දැනුම් දීමකින් තොර ව සම්මුඛ පරීක්ෂණයට සහභාගි නොවන ඒ ඒ දිස්ත්‍රික්කයේ/ ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අයදුම්කරුවන් වෙනුවට අදාළ දිස්ත්‍රික්කයෙන්/ අදළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් සුදුසුකම් අනුපිළිවෙළට වෙනත් අයදුම්කරුවන් කැඳවනු ලබන අතර නොපැමිණි අයදුම්කරුවන් පිළිබඳ ව නැවත සලකා බලනු නො ලැබේ.

7.2 සියලුම සහතිකවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණ දිනට ඉදිරිපත් කිරීම අනිවාර්ය වන අතර එදිනට මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් තෝරා ගනු නො ලැබේ.

7.3 පාඨමාලාවේ අපේක්ෂිත මට්ටමට ළඟා වීමට මෙන් ම ගුරුවෘත්තියට පිවිසීමට අයදුම්කරුවන් වෙත තිබිය යුතු කායික හා මානසික යෝග්‍යතාවය, අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලබා දෙන නිර්ණායකයන් ඔස්සේ පළමු සම්මුඛ පරීක්ෂණයේ දී අදාළ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් පරීක්ෂා කර බලනු ලැබේ. එහි දී පාඨමාලාව හැදෑරීමට සහ ගුරුවෘත්තියට පිවිසීමට අයදුම්කරු සතු කායික, මානසික යෝග්‍යතාවය ප්‍රමාණවත් ද යන්න පිළිබඳ ව ඔවුන් තම නිර්දේශය ඉදිරිපත් කරනු ලැබේ.

7.4 ඉහත 7.3 ඡේදය අනුව තෝරා ගනු ලබන අයදුම්කරුවන් වෙත ලියාපදිංචි තැපෑලෙන් ඒ බව දැනුම් දෙනු ඇත. අධ්‍යාපන විද්‍යාපීඨයේ ලියාපදිංචිය සිදු කරන අවස්ථාවේ දී නැවත වතාවක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් ඉදිරිපත් වී ඇති තොරතුරුවල නිරවද්‍යතාව සනාථ කර ගැනීමක් සිදු කෙරේ. අදාළ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ ලියාපදිංචි වීමට නියමිත දිනයේ සිට රාජකාරි දින දහයක් (10) ඇතුළත ලියාපදිංචි නොවුවහොත් ඇතුළත්වීමේ අවස්ථාව ඔහුට/ ඇයට අහිමි වනු ඇත. ඒ අනුව ඇති වන පුරප්පාඩු බඳවා ගැනීමේ පදනම යටතේ අදාළ කුසලතා අනුපිළිවෙළට පුරවනු ලැබේ.

7.4.1 එබැවින් නියමිත දිනට ලියාපදිංචි නොවන අයදුම්කරුවන් විසින් පසුව කරනු ලබන ඉල්ලීම් පිළිබඳ ව කිසිසේත් ම සලකා බැලීමට අවස්ථාව නොමැති බව අවධාරණය කෙරේ.

- සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයකට නිර්දේශ ලබා දීමට නොහැකි මට්ටමේ යම් සුවිශේෂී ගැටළු තත්ත්වයන් නිරීක්ෂණය වුවහොත් පමණක් විශේෂ කමිටුවකට යොමු කෙරේ. එම වාර්තාව අධ්‍යාපන විද්‍යායතන මණ්ඩලයට/ අධ්‍යාපන ලේකම්ට ඉදිරිපත් කර ලබා ගන්නා තීරණ ක්‍රියාත්මක කරනු ඇත.

7.5 පළමු හා දෙවන සම්මුඛ පරීක්ෂණවලට පෙනී සිටීමෙන් අනතුරු ව විද්‍යාපීඨයේ ලියාපදිංචිය සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවන් අධ්‍යාපන විද්‍යාපීඨවලට ඇතුළත් වීමට පෙර තම සෞඛ්‍ය තත්ත්වය සනාථ කරනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු වේ.

7.6 යම් පාඨමාලාවකට/ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයකට තෝරාගත් පසු ඒ පාඨමාලාව/ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය වෙනස් කිරීමට ඉඩ දෙනු නො ලැබේ. කිසියම් පාඨමාලාවකට ප්‍රමාණවත් ශික්ෂණලාභීන් සංඛ්‍යාවක් යම් විද්‍යාපීඨයක නොමැති අවස්ථාවක අදාළ පාඨමාලාව ක්‍රියාත්මක වන ළඟ ම ඇති විද්‍යාපීඨයකට මාරු කරනු ලැබේ.

7.7 ප්‍රමාණවත් ගුරු අවශ්‍යතාවක් නොපවතින පාඨමාලා අහෝසි කිරීම, බඳවා ගන්නා ශික්ෂණලාභීන් සංඛ්‍යාව තීරණය කිරීම හා එක් එක් පාඨමාලා ආයතන තුළ ස්ථානගත කිරීම පිළිබඳ අවසාන තීරණය අධ්‍යාපන විද්‍යායතන මණ්ඩලය/අධ්‍යාපන ලේකම් සතු ය.

**8.0 පාඨමාලා සඳහා අයදුම් කිරීමට හෝ ඇතුලත් වීමට නුසුදුස්සන් :**

8.1 දැනටමත් රජයේ හෝ රජයේ ආධාර ලබන උපකෘත පාසල්වල, රජයේ ලියාපදිංචි පිරිවෙන්වල හෝ අනුමත වෙනත් විද්‍යායතනවල ගුරු පත්වීම් ලබා ඇති අය,

8.2 රජයේ පාසලක පත්වීමක් සඳහා තෝරාගනු ලැබ සිටින අය,

8.3 මේ වන විටත් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක පාඨමාලාවක් හදාරමින් සිට හැර ගිය හෝ හදාරමින් සිටින හෝ හදාරා අවසන් කළ අය,

8.4 විශ්වවිද්‍යාලයක/ විශ්වවිද්‍යාල විද්‍යායතනයක/ වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක අ.පො.ස. (උ. පෙළ) සුදුසුකම්වලින් බඳවා ගනු ලබන වෘත්තීය පුහුණු පාඨමාලාවක්/උසස් ඩිප්ලෝමාවක්/උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා ''රජයේ නිදහස් අධ්‍යාපන වරප්‍රසාද'' යටතේ අභ්‍යන්තර ශිෂ්‍යයෙකු ලෙස ලියාපදිංචි වී සිටින/හදාරමින් සිටින හෝ උපාධි පාඨමාලාවක් හදාරා අවසන් කළ අය (දැනට ඉහත ආයතනයක මෙම ඡේදයේ සඳහන් පාඨමාලාවකට ලියාපදිංචි වී සිටින සිසුන් *ගැසට්* නිවේදනය පළවීමෙන් පසුව ලියාපදිංචිය අවලංගු කර ගත්ත ද ඔවුහු අයදුම් කිරීමට/ඇතුලත් වීමට සුදුසුකම් නො ලබති) තව ද *ගැසට්* නිවේදනය පළවීමෙන් පසුව/ සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමෙන් පසුව ද ඉහත ආයතනයක අදළ පාඨමාලාවක ලියාපදිංචි වී, එය අවලංගු කර ගත්ත ද ඔවුහු ද ඇතුළත් වීමට සුදුසුකම් නො ලබති.

8.5 විනයානුකූල හේතූන් මත හෝ වෙනත් හේතූන් මත ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයකින් ශිෂ්‍ය භාවය අවලංගු කරනු ලැබූ අය,

8.6 විවාහ වී සිටින හෝ විවාහ ගිවිසගනු ලැබූ හෝ දික්කසාද වූ අයදුම්කරුවන්.

**9.0 පාඨමාලාව සඳහා අදාළ කොන්දේසි :**

9.1 පාඨමාලාවක කාල සීමාව අවුරුදු තුනකි. එය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ අවුරුදු දෙකක නේවාසික ආයතනික පුහුණුවකින් ද, පාසලකට අනුයුක්ත ව සිදු කෙරෙන වසරක සීමාවාසී පුහුණුවකින් ද සමන්විත වේ. දෙවන වසර අවසානයේ දී විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන බාහිර අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා ශික්ෂණලාභියාගේ පැමිණීම 90% ක ට නොඅඩුවීම අනිවාර්ය වේ.

9.2 සෑම ශික්ෂණලාභියෙකු ම පළමු වසරේ සහ දෙවන වසරේ පවත්වනු ලබන අභ්‍යන්තර අඛණ්ඩ ඇගයීම් හා අභ්‍යන්තර පරීක්ෂණවලින් හා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වන බාහිර අවසාන විභාගයෙන් ද සමත් විය යුතු යි. එමෙන් ම ඉංග්‍රීසි මාධ්‍ය පාඨමාලා හදාරන අය හැර අනෙක් සියලුම පාඨමාලා හදාරන අය ඉහත විභාගවල දී ඉංග්‍රීසි විෂයයෙන් සමත් විය යුතු ය.

9.3 ශික්ෂණලාභියෙකුට නේවාසික ව අධ්‍යයන කටයුතුවල යෙදෙන වර්ෂ දෙක තුළ දී වර්ෂයකට මාස දහයක් (10) සඳහා මාසයකට රු. 3,500 ක වටිනාකමින් යුත් ආහාරපාන හා නේවාසික පහසුකම් සපයනු ලැබේ. සීමාවාසි වර්ෂය තුළ දී මාස දහයක් (10) සඳහා මාසයකට රු. 4,000 බැගින් යුත් දීමනාවක් ගෙවනු ලැබේ. පෞද්ගලික අවශ්‍යතාවලට අදාළ සෙසු වියදම් ශික්ෂණලාභියා විසින් දැරිය යුතු ය.

